# 2024

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

## ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංක 186



# ශ්‍රී ලංකා ජනාධිපති
## இலங்கை சனாதிபதி
## President of Sri Lanka

පණිවිඩය

2024 වර්ෂය සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම සතුටක් වන අතර, එහිදී "ඩිජිටල් ශ්‍රී ලංකාවක් " යන අපගේ දැක්ම, එනම් නවෝත්පාදනය, තාක්ෂණය සහ විනිවිදභාවය තුළින් සෑම පුරවැසියෙකුම, ව්‍යාපාරයක්ම සහ රාජ්‍ය ආයතනයක්ම එක්ව ප්‍රතිලාභ ලබන රටක් බවට අපේ රට පත් කිරීම කෙරෙහි අපගේ කැපවීම අවධාරණය කෙරේ.

රජය " ඩිජිටල් ආර්ථිකයක් සඳහා වන සැලැස්ම " සම්පූර්ණයෙන්ම සකසා ඇති අතර, එමගින් ඩිජිටල්කරණය වේගවත් කිරීම, ශක්තිමත් ඩිජිටල් ආර්ථිකයක් වර්ධනය කිරීම මෙන්ම නවීන සහ නවෝත්පාදක තාක්ෂණයන්හි ප්‍රවර්ධනය අරමුණු කෙරේ. මෙම උපායමාර්ගික වැඩපිළිවෙළ මගින් ශ්‍රී ලංකාව ඩිජිටල් නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය සඳහා තරගකාරී මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට බලාපොරොත්තු වේ.

විනිවිදභාවයෙන් යුත්, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කිරීම, ඩිජිටල් කර්මාන්තය පුළුල් කිරීම, ඩිජිටල් ආර්ථිකය දියත් කිරීම, උපායමාර්ගික කර්මාන්ත ඩිජිටල් පරිවර්තනයකට ලක් කිරීම, රජය සහ පුරවැසියන්ගේ ශක්‍යතා වර්ධනය කිරීම ලෙස අපගේ දැක්ම මූලිකව ප්‍රතිපත්ති 05ක් මත පදනම්ව තිබේ.

අපගේ ප්‍රමුඛතම වැඩසටහන් අතරින් " ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම් (SLUDI - Sri Lanka Unique Digital Identity)"වැඩපිළිවෙළ මගින් පුරවැසියන් සඳහා ආරක්ෂිත, ජෛවමිතික පදනම් කර ගත් ඩිජිටල් හැඳුනුම් පද්ධතියක් නිර්මාණය කිරීම අරමුණු කෙරේ. එමගින් ගමන් බලපත්‍ර නිකුත් කිරීම, රියදුරු බලපත්‍ර, සමාජ ආධාර, බදු ගෙවීම් වැනි රාජ්‍ය සේවාවන් කාර්යක්ෂමව ලබා දීම සිදු වේ.

GovPay යනු රජයේ මූල්‍ය ගනුදෙනු විධිමත් කිරීම සඳහා සකස් කළ ආරක්ෂිත, ඩිජිටල් ගෙවීම් වේදිකාවකි. එසේම, Lanka Government Network මගින් රාජ්‍ය ආයතන ඩිජිටල් ලෙස සම්බන්ධ කරන අතර, Lanka Government Cloud යනු රාජ්‍ය ඩිජිටල් සේවා ආරක්ෂිතව සහ කාර්යක්ෂමව මෙහෙය වීම සඳහා වූ පද්ධතියයි.

මීට අමතරව, "2024 ගෝලීය ඩිජිටල් ආයෝජන සමුළුව " මගින් ශ්‍රී ලංකාව නවෝත්පාදන කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කිරීමේ හැකියාව පෙන්වා දුන් අතර, තිරසාර සංවර්ධනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට අපගේ ඇති කැපවීම එයින් නිරූපණය කෙරිණ. එය සියලු දෙනා ඇතුළත් කර ගත් ඩිජිටල් අනාගතයක් කරා මෙහෙය වීමට උපකාරී වේ.

මෙම නියාමන ප්‍රයත්නවලට සමගාමීව පිහිටුවන ජාතික දත්ත හුවමාරුව (NDX - National Data Exchange) යනු රාජ්‍ය ආයතන සහ විවිධ අංශවල පාර්ශ්වකරුවන් අතර ආරක්ෂිතව දත්ත හුවමාරු කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා යෝජිත මධ්‍යගත වේදිකාවකි. මෑතකදී දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවන ලද අතර, එයින් රට තුළ පෞද්ගලික දත්ත ආරක්ෂණය සහ ඒ පිළිබඳ නීති අධීක්ෂණය, නියාමනය සහ ක්‍රියාත්මක කිරීම සිදු කරයි.

අපගේ ඩිජිටල් සංවර්ධන වැඩසටහන ඉදිරියට ගෙන යාම සඳහා නිරතුරුව කැප වී සිටින සියලුම නිලධාරීන්ට සහ ආයතනවලට මාගේ ස්තුතිය පිරිනමන අතර, නොසැලෙන ධෛර්යය සහ අධිෂ්ඨානය ඇතිව, අපගේ සියලු විභවතා සහ හැකියාවන් උපයෝගී කරගනිමින් නවීන සහ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම වෙනුවෙන් එක්වෙන ලෙස සියලු දෙනාට හෘදයාංගමව ආරාධනා කරමි.

අනුර කුමාර දිසානායක
ඩිජිටල් ආර්ථික අමාත්‍ය සහ
ජනාධිපති
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**ගරු ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය**



මෙම වර්ෂයේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ (MoDE) වාර්ෂික ප්‍රගති සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම මහත් අභිමානයකි. මෙය ශ්‍රී ලංකාවේ නවීන සහ ගෝලීය වශයෙන් තරඟකාරී ඩිජිටල් රාජ්‍යයක් ගොඩනැගීම සඳහා ගෙන ඇති පියවරවල පිළිබිඹුවකි. 2024 වර්ෂය මූලික පරිවර්තනයකින් යුක්ත වූ අතර, ජාතික ඩිජිටල් යටිතල පහසුකම් වේගවත් කිරීම, පුරවැසි-කේන්ද්‍රීය සේවාවන් දියුණු කිරීම සහ නවෝත්පාදනය සහ රාජ්‍ය අංශයේ නවීකරණය සඳහා වූ පරිසර පද්ධතිය විස්තීරනයක් සිදු විය.

**මූල්‍ය අන්තර්ගතභාවය සහ ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම**

අපගේ ප්‍රධාන ජයග්‍රහණ අතරින් Gov Pay යන යෙදවුම සැලකිය යුතු වර්ධනයක් සිදු විය. මාස 10ක් තුළ පමණක් රුපියල් මිලියන 1,950කට අධික ඩිජිටල් ගනුදෙනු සිදු කරමින්, රජයේ ආයතන 215ක් ඒකාබද්ධ සහ ආරක්ෂිත ඩිජිටල් ගෙවීම් පරිසර පද්ධතියකට සම්බන්ධ කිරීම කර ඇත. මෙම ව්‍යාපෘතිය හුදෙක් ඩිජිටල් පහසුකම් සැපයීම වඩා රාජ්‍ය සේවාවන්හි විශ්වාසය සහ විනිවිදභාවය ගොඩනැගීමේ තීරණාත්මක සන්ධිස්ථානයකි.

මෙයට සමගාමීව, රථවාහන ස්ථානීය දඩ ක්‍රමය වැඩිදියුණු කිරීම කිරීම මගින් පුරවැසියන්, පොලීසිය සහ නීති පද්ධතිය සමඟ සම්බන්ධ වන ආකාරය වෙනස් කර ඇත. එය තත්කාලීන ඩිජිටල් ගෙවීම් සක්‍රිය කරමින් පරිපාලන දුශ්කරතා අවම කරයි. එසේම, පොදු ප්‍රවාහන අංශය සඳහා කාඩ්පත් මගින් ගෙවීමට පහසුකම් හඳුන්වාදීම ආරම්භ කර ඇති අතර, එය දෛනිකව මිලියන ගණනක් වූ මගීන් සඳහා පහසුකම් වැඩි කරමින් තත්‍ය මුදල් භාවිතය රහිත සමාජයක් ගොඩනැගීමේ තීරණාත්මක පියවරකි.

**පාලනය සඳහා වූ ඩිජිටල් අඩිතාලම ස්ථාපිත කිරීම**

මෙම වර්ෂය ශ්‍රී ලංකාවේ ඩිජිටල් පාලන රාමුවේ හැරවුම් ලක්ෂ්‍යයක් විය:

- අමාත්‍යාංශයේ ඩිජිටල් පරිවර්තන අංශය ලෙස ගව්ටෙක් ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගම (GovTech Sri Lanka (Pvt.) Ltd.) ස්ථාපිත කිරීම ව්‍යුහාත්මක උපායමාර්ගික ගමනකි. එය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාද අවම කිරීම සහ ජාතික මට්ටමේ වේදිකා මෙහෙයවීම සඳහා අභ්‍යන්තර තාක්ෂණික ධාරිතාව ගොඩනැගීම අරමුණු කරයි. ගව්ටෙක් ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගම ඩිජිටල් පොදු යටිතල පහසුකම් මුලපිරීම් සඳහා නායකත්වය දෙමින්, අමාත්‍යාංශයේ නවෝත්පාදන සහ බෙදාහැරීමේ බලවේගය ලෙස ක්‍රියා කරයි.
- යහපාලන සහ විනිවිදභාවය සහිතව සහන සහ ප්‍රතිලාභ හිමිවිය යුතු අදාළ පුරවැසියන් වෙත ලබා දෙන බව සහතික කිරීම සඳහා සහන සහ ප්‍රතිලාභ පද්ධති ඩිජිටල්කරණය සහ ඒකාබද්ධ කිරීමට ජාතික සමාජ ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (National Social Security Operation Centre) දියත් කෙරිණි.
- 2026 තෙවන කාර්තුව වන විට ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් අනන්‍යතාවය (SLUDI) ජාතික වශයෙන් දියත් කිරීම සඳහා මූලික කටයුතු ස්ථිරව තබා ඇති අතර, තාක්ෂණික සැලසුම පෞද්ගලිකත්ව ආරක්ෂණය සහ ආයතනික සම්බන්ධීකරණය සාර්ථකව සිදුවෙමින් පවතී.

**ඩිජිටල් අනාගතය සඳහා වූ නීතිමය පදනම**

අයිතිවාසිකම් සුරකින ඩිජිටල් අනාගතයක් සඳහා සූදානම් වෙමින්, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට (Personal Data Protection Act) තීරණාත්මක සංශෝධන ගෙන එන ලදී. මෙම ප්‍රතිසංස්කරණ මගින් පූර්ණ බලාත්මක කිරීම, නියාමන බලතල පෙළගැස්වීම, වගවීමේ යාන්ත්‍රණයන් සහ දේශසීමා විධිවිධාන කරා යන පළමු පියවර සනිටුහන් වේ. මෙම පනත ක්‍රියාත්මක වූ පසු රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ දත්ත ඩිජිටල් භාවිතයන්හි විශ්වාසය ආරක්ෂා කිරීමේ මූලික පදනම ලෙස ක්‍රියා කරනු ඇත.

**5G තාක්ෂණය සහ ඊට ඔබ්බට සංඛ්‍යාත වර්ණාවලිය විවෘතකිරීම**

ඊළඟ පරම්පරාවේ 5G සම්බන්ධතාවය උත්ප්‍රේරනය කිරීමේ සන්ධිස්ථානක් ලෙස, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් ශ්‍රී ලංකාවේ පළමු 5G සංඛ්‍යාත වර්ණාවලි වෙන්දේසිය 2025 දෙසැම්බර් 18 වැනිදා පැවැත්වේ. මෙම වෙන්දේසිය මධ්‍යම තලයේ වර්ණාවලිය වාණිජ්‍ය භාවිතයට නිකුත් කෙරන අතර, සේවා සපයන්නන් හට වේගවත්, විශ්වාසනීය සහ ප්‍රමාදයක් තොරව ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් සේවාවන් ලබාදීමට හැකියාව ලැබෙනු ඇත. මෙම වෙනස ශ්‍රී ලංකාව පුරා IoT, AI, ක්ලවුඩ් ගේමිං සහ ස්මාර්ට් නගර යෙදවුම්වල නව සීමාවන් විවර කරනු ඇත.

**විකාශන සහ සම්බන්ධතා යටිතල පහසුකම් නවීකරණය**

රූපවාහිනී විකාශන ඩිජිටල්කරණය (DTTB) ව්‍යාපෘතිය මේවන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර ශ්‍රී ලංකාවේ ඇනලොග් රූපවාහිනී පද්ධතිය සම්පූර්ණ ඩිජිටල් වේදිකාවකට පරිවර්තනය කෙරේ. මෙය විකාශන ගුණාත්මකභාවය සහ ග්‍රාමීය ප්‍රවේශය වැඩිදියුණු කිරීම පමණක් නොව, සංඛ්‍යාත වර්ණාවලිය විවෘත කරමින් බ්‍රෝඩ්බෑන්ඩ් ව්‍යාප්තිය, 5G තාක්ෂණය දියුණු කිරීම සහ වෙනත් විදුලි සංදේශ නවෝත්පාදන සඳහා යළි භාවිතයට ඉඩ සලසයි.

**ජාතික ප්‍රදර්ශන සහ ජාත්‍යන්තර සහභාගීත්වය**

2025 ශ්‍රී ලංකා ටෙක්ෆ්‍රන්ට් දෙසතිය ඩිජිටල් මාසයේ කොටසක් ලෙස සැමරීමට සැලසුම් කර ඇති අතර එය ව්‍යවසායකයන්, ආයෝජකයන් සහ පර්යේෂකයන් සඳහා ජාතික වේදිකාවක් නිර්මාණය කරයි. Disrupt Asia 2025, FinTech සමුළුව සහ AI Expo වැනි ප්‍රමුඛ සන්ධිස්ථාන ශ්‍රී ලංකාවේ නවෝත්පාදන හැකියාව ගෝලීයව ප්‍රදර්ශනය කරමින් ජාත්‍යන්තර සහයෝගීතාව සහ ව්‍යාපාරික අරමුදල් සඳහා මාර්ග විවර කරයි.

**ඉදිරි ගමන් මග**

මෙම සන්ධිස්ථාන සිදුවීම් හුදෙක් තාක්ෂණික ජයග්‍රහණ පමණක්ම නොවේ — ඒවා සියල්ල ඇතුළත්වූ සංවර්ධනය, ස්වෛරී ඩිජිටල් යටිතල පහසුකම්වලට සහ අනාගතයට සූදානම් රජයක් වශයෙන් අපගේ මූලික කැපවීම නියෝජනය කරයි. ඉදිරියේදී, අමාත්‍යාංශය පුරවැසි ප්‍රතම ඩිජිටල් සේවාවන් බෙදාහැරීම, පෞද්ගලික අංශයේ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව සඳහා ඉහළ වටිනාකමකින් යුතු ඩිජිටල් රැකියා නිර්මාණය කිරීමට අඛණ්ඩව කැපවී සිටියි.

2025 වර්ශයේ දී අපගේ ගමනට දායක වූ සියලු රාජ්‍ය නිලධාරින්ටත්, පෞද්ගලික හවුල්කරුවන්ටත්, ප්‍රදාන ආයතන සහ කාර්ය මණ්ඩල සාමාජිකයන්ටත් මගේ හෘදයාංගම කෘතඥතාව පුද කරමි. එකට එක්වී, තාක්ෂණය මගින් සෑම ශ්‍රී ලාංකිකයෙකුම බලගන්වන අනාගතයක් හැඩගස්වමින් සිටිමු.

අරමුණ, නවෝත්පාදනය සහ අඛණ්ඩ අධිෂ්ඨානය සමඟ ඉදිරියට යමු.

**ඉංජිනේරු එරංග වීරරත්න**
**ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍ය**
**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය**

**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශ ලේකම්ගේ පණිවිඩය**



2024 වසර, ශ්‍රී ලංකාව වඩාත් ස්ථාවර, සියල්ලන් ඇතුළත් කර ගත් සහ නවෝත්පාදනය මත පදනම් වූ ඩිජිටල් අනාගතයක් කරා යන ගමනේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මෑත කාලීන ආර්ථික දුර්වලතා අභියෝග මධ්‍යයේ වුවද, ප්‍රතිපත්ති පරිසරය සහ පරිණාමය වන ජාතික ප්‍රමුඛතා හැඩගැස්වීම සඳහා අමාත්‍යාංශය විසින් සැලකිය යුතු උත්සාහයන් ගන්නා ලදී. මෙරට ඩිජිටල් පදනම් ශක්තිමත් කිරීම, රාජ්‍ය සේවා සැපයීම නවීකරණය කිරීම සහ තාක්ෂණය මත පදනම් වූ ආර්ථික වර්ධනය සක්‍රීය කිරීම සඳහා වූ එහි කැපවීම වඩාත් ස්ථිරසාරව සිටින ලදි.

වාර්තාකරණයට අදාළ වර්ෂය තුළ, මෙම අමාත්‍යාංශය ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගත්තේය. ඩිජිටල් පොදු යටිතල පහසුකම් පුළුල් කිරීම, ඉ-රාජ්‍ය වේදිකා දියුණු කිරීම, ජාතික සයිබර් ආරක්ෂණ රාමු ශක්තිමත් කිරීම, නැගී එන තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම සහ රාජ්‍ය අංශය සහ සමාජය පුරා ඩිජිටල් කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම් මෙයට ඇතුළත් විය. මෙම ජයග්‍රහණ අපගේ නිලධාරීන්, හවුල්කාර ආයතන සහ පාර්ශවකරුවන්ගේ කැපවීම සහ වෘත්තීයභාවය පිළිබිඹු කරන අතර, ඔවුන්ගේ සාමූහික උත්සාහයන්ගේ අඛණ්ඩතාව සහ ප්‍රගතිය සහතික කරයි.

2024 සැප්තැම්බර් මාසයේදී, ශ්‍රී ලංකාව නව රජයක් තෝරා පත් කර ගැනීම සහ පසුව ආයතනික බලතල නැවත සකස් කිරීමත් සමඟ නව පරිච්ඡේදයකට පිවිසියේය. මෙම සන්දර්භය තුළ, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය පිහිටුවීම, ජාතික සංවර්ධනයේ කේන්ද්‍රීය කුළුණක් ලෙස ඩිජිටල් සංවර්තනය හඳුනා ගනිමින්, ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්ති තීරණයක් සනිටුහන් කරයි. වැඩසටහන් සහ සේවාවන් බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කරමින්, ස්ථාවරත්වය, වගවීම, සම්පත් ප්‍රශස්තිකරණය සහ ජාතික ප්‍රමුඛතා සමඟ පෙළගැස්වීම කෙරෙහි දැඩි අවධානයක් යොමු මෙම සංක්‍රාන්තිය කළමනාකරණය කරන ලදී.

නව අමාත්‍යාංශය යටතේ, 2030 වන විට ශක්තිමත් ඩිජිටල් ආර්ථිකයක් අත්කර ගැනීමේ පැහැදිලි දැක්මක් සහිතව ශ්‍රී ලංකාවේ ඩිජිටල් න්‍යාය පත්‍රය තවදුරටත් තියුණු කර ඇත. මෙම දැක්ම මඟින් ඇතුළත් ඩිජිටල් ප්‍රවේශය, දත්ත මත පදනම් වූ පාලනය, නවෝත්පාදන-හිතකාමී නියාමනය, ඩිජිටල් ව්‍යවසායකත්වය සහ ප්‍රධාන ආර්ථික අංශ හරහා තාක්ෂණය ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙයි. රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාව පෝෂණය කිරීම, ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සහ ඩිජිටල් ප්‍රගතිය සියලු පුරවැසියන්ට ඉමහත් ප්‍රතිලාභ ලබා දෙන බව සහතික කිරීම සඳහා අමාත්‍යාංශය කැපවී සිටී.

2024 වසරේ ජයග්‍රහණ ගැන මෙනෙහි කරමින් සහ අප ඉදිරියේ ඇති අවස්ථා සහ වගකීම් දෙස බලා සිටින අතරතුර, අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ට, අනුබද්ධ ආයතනවලට, සංවර්ධන හවුල්කරුවන්ට සහ කොටස්කරුවන්ට ඔවුන්ගේ කැපවීම සහ සහයෝගීතාවය වෙනුවෙන් මම මගේ අවංක කෘතඥතාව පළ කරමි. තරඟකාරී, සියල්ලන් ඇතුළත් සහ අනාගතයට සූදානම් ඩිජිටල් ලෙස බලගැන්වූ ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට මෙම සාමූහිකත්වය යටතේ අපි කැපවී සිටිමු.

**වරුණ ශ්‍රී ධනපාල**
**ලේකම් (වැ.බ.)**
**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය**

# පටුන


**පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / විධායක සාරාංශය ........................................ 1**

1.1 හැඳින්වීම ........................................ 1

1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු ........................................ 1

1.3 ආයතනයේ විෂයයන් සහ කාර්යභාරයන් ........................................ 1

1.4 ක්‍රියාත්මක කෙරෙන නීති සහ අණපනත් ........................................ 2

1.5 සංවිධාන ව්‍යුහය ........................................ 3

1.6 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු / ආයතන ........................................ 3

1.7 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර ........................................ 4

**පරිච්ඡේදය 02 – ප්‍රගතිය සහ අනාගත දැක්ම ........................................ 5**

2.1 ප්‍රගතිය සහ ඉදිරි දැක්ම :ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය ........................................ 5

2.2 ප්‍රතිපත්ති සහ උපායමාර්ගික මුලපිරීම් ........................................ 7

*2.2.1 ජාතික ඩිජිටල් ආර්ථික උපායමාර්ගය…………………………… ………..……..7*

*2.2.2 කෘත්‍රිම බුද්ධිය (AI) පිළිබඳ ජාතික උපායමාර්ගය…………………………………….8*

*2.2.3 අනෙකුත් ප්‍රතිපත්ති මුලපිරීම්………………………………………………………..8*

2.3 මෑත කාලීන වර්ධනයන් ........................................ 8

2.4 අමාත්‍යාංශයේ අනාගත සැලසුම ........................................ 9

2.5 ඩිජිටල්කරණය සඳහා මූල්‍ය පහසුකම් ........................................ 10

2.6 භෞමික රූපවාහිනී විකාශන (DTTB) ව්‍යාපෘතිය ........................................ 11

2.7 ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සබඳතා ........................................ 11

2.8 ගෝලීය ව්‍යාපාරික නායකයින් සමඟ සම්බන්ධ වීම ........................................ 11

**පරිච්ඡේදය 03 -2024 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය ........................................ 13**

3.1 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය - ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය ........................................ 13

3.2 මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් ........................................ 16

3.3 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය ........................................ 16

3.4 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය ........................................ 16

3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........................................ 17

3.6 අභ්‍යන්තර විගණන වාර්තාව ........................................ 18

**පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක ........................................ 25**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ........................................ 25

**පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ........................................ 26**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න. ........................................ 26

5.2 තිරසාර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග ........................................ 27

**පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ ........................................ 28**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ............................................................................................. 28
6.2 මානව සම්පත් සංවර්ධනය ............................................................................................. 29
**පරිච්ඡේදය 07 අනුකූලතා වාර්තාව ............................................................................................. 30**
**පරිච්ඡේදය 08 - අමාත්‍යාංශය යටතේ ඇති ආයතන ............................................................................................. 36**
8.1 ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT)............................................................................................. 36
8.2 විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL)............................................................................................. 41
8.3 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (DRP) ............................................................................................. 44
8.4 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)............................................................................................. 45
8.5දත්ත ආරක්ෂණ අධිකාරිය (DPA)............................................................................................. 50
8.6 ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) ............................................................................................. 53

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

### 1.1 හැඳින්වීම

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් 44 (1), 45 (1) සහ 47 (1) (අ) (ආ) වගන්ති යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ශ්‍රී ලංකා අතිගරු ජනාධිපතිතුමා විසින් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද අතර 2024 නොවැම්බර් 18 දිනැති අංක 2411/09 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී.**

### 1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු

**දැක්ම**

ඩිජිටල් විශිෂ්ටත්වයෙන් සවිබල ගැන් වූ සෞභාග්‍යමත් ජාතියක්

**මෙහෙවර**

සාමාජීය හා කාර්මික සංවර්තනය තුළින් තාක්ෂණික දියුණුව, නවෝත්පාදනය සහ සංවර්ධනය යන ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා තාක්ෂණය පදනම් කරගත් ප්‍රතිපත්ති, උපාය මාර්ග, ප්‍රමුඛතා, වැඩසටහන්, සැලසුම් සහ මාර්ගෝපදේශ නිර්මාණය කිරීම සහ පුනර්ජීවනය කිරීම.

**අරමුණු**

i. විනිවිදභාවයෙන් යුත් සහ කාර්යක්ෂම රජයක් ගොඩනැගීම
ii. ඩිජිටල් කර්මාන්තය වර්ධනය කිරීම
iii. ඩිජිටල් ආර්ථිකය මෙහෙයවීම
iv. උපායමාර්ගික කර්මාන්තවල ඩිජිටල් පරිවර්තනය
v. කර්මාන්ත, රජය සහ පුරවැසියන්ගේ ධාරිතා සංවර්ධනය

### 1.3 ආයතනයේ විෂයයන් සහ කාර්යභාරයන්

1.3.1 රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ඩිජිටල් ආර්ථික විෂයයන්ට සම්බන්ධ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ ලැයිස්තුගත රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරිම සහ ඇගයීම.

1.3.2 අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂම හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.

1.3.3 නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යය භාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

1.3.4 සමාජයේ සියලුම ස්ථරවල තොරතුරු තාක්ෂණය භාවිතය ධෛර්යමත් කිරීම හා ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ පුද්ගලික අංශය සමග හවුල් වී තොරතුරු තාක්ෂණ මූලාරම්භයන් සම්බන්ධීකරණය කිරීම හා පහසුකම් සැලසීම.

1.3.5 සයිබර් ආරක්ෂණයට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් සක්‍රීයව මැදිහත්වීම හා එවැනි සිද්ධීන් වැළැක්වීම.

1.3.6 ඩිජිටල් ව්‍යෝහාරික පරීක්ෂණ සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහය ලබාදීම.

1.3.7 ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු.

1.3.8 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කටයුතු.

1.3.9 අමාත්‍යාංශය යටතට පවරා ඇති ආයතනවල විෂයයන්ට සම්බන්ධ කටයුතු.

1.3.10 අමාත්‍යාංශය යටතට පවරා ඇති ආයතන සියල්ලේ අධීක්ෂණ කටයුතු කිරීම.

## 1.4 ක්‍රියාත්මක කෙරෙන නීති සහ අණපනත්

1.4.1. 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත

1.4.2. 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත සහ එහි සංශෝධන


1.4.3. 2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ එහි සංශෝධන

1.4.4. 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත.

1.4.5. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සහ එහි සංශෝධන

1.4.6. නිශ්චිතව දක්වා ඇති විෂයයන්ට අදාළ අනෙකුත් සියලුම නීති (වෙනත් කිසිදු අමාත්‍යවරයෙකුගේ විෂය පථයට නිශ්චිතව පවරා නොමැති

## 1.5 සංවිධාන ව්‍යුහය




## 1.6 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු / ආයතන

1.6.1 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (DRP)

1.6.2 ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SL CERT)

1.6.3 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)

1.6.4 ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය (DPA)

1.6.5 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL)

1.6.6 ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.

1.6.7 තොරතුරු තාක්ෂණ උද්‍යාන – යාපනය සහ මන්නාරම

## 1.7 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර

i. නම: ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම (SLUDI)

ii. හවුල්කාරිත්ව ආයතනය: ඉන්දීය රජය (GoI)

iii. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය: රුපියල් බිලියන 14.00

(GOI මූල්‍ය ප්‍රදානය - ශ්‍රී ලංකා රු. බිලියන 11.00 සහ ශ්‍රී ලංකා රජයේ දායකත්ව ප්‍රතිපාදන ශ්‍රී ලංකා රු. බිලියන 3.00)

iv. ව්‍යාපෘති කාලය: 2021 - 2024

## පරිච්ඡේදය 02 – ප්‍රගතිය සහ අනාගත දැක්ම

### 2.1 ප්‍රගතිය සහ ඉදිරි දැක්ම: ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

| අඅ/ | ව්‍යාපෘති නාමය | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | සමස්ත ඇස්තමේන්තු ගත පිරිවැය (TEC) (රු. මි.) | සමුච්චිත වියදම (රු. මි) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය (%) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව (GovPay) - නියමු ව්‍යාපෘතිය<br><br>Government Digital Payment Platform (GovPay) - Pilot project | පුරවැසියන්ට රජයේ ආයතන වෙත ඉලෙක්ට්‍රොනික මාර්ග භාවිතයෙන් කාර්යක්ෂම, ආරක්ෂිත සහ විනිවිද භාවයකින් යුත් මාර්ගගත ගෙවීම් යාන්ත්‍රණයක් සක්‍රිය කිරීම සහ ඒ තුළින් ඩිජිටල් ආර්ථිකයට දායක වීම. | 2023-2024 | 200.00 | 0.08 | 85% | ප්‍රතිලාභ රාජ්‍ය ආයතන 16ක් සහ බැංකු 10ක් සහ ෆින්ටෙක් ආයතන 2ක් සම්බන්ධ කර ගනිමින් නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකාපේ (lankaPay) සහ මොබිටෙල් යන ආයතන රජයට කිසිදු වියදමක් ඇති නොවන පරිදි සේවා සැපයීමේ උපායමාර්ගික හවුල්කරුවන් ලෙස කටයුතු කරයි. මෙම ව්‍යාපෘතිය 2025 පෙබරවාරි 7 වන දින ආරම්භ කරන ලදී .2025 වසර තුළ රජයේ ආයතන 100ක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ. |
| 2 | ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් අනන්‍යතාවය<br><br>Sri Lanka Unique Digital Identity (SLUDI) | වයස අවුරුදු 15 සහ ඊට වැඩි සියලු ශ්‍රී ලාංකිකයන් ජෛවමිතිකව අනන්‍යතා තහවුරු කළ සඳහා සම්පූර්ණ ජෛවමිතික හැකියාව (ඇස්වල කළු ඉංගිරියාව, මුහුණ සහ ඇඟිලි සලකුණු හඳුනාගැනීම) සහිත විශ්වාසදායක -, ආරක්ෂිත සහ නිවැරදි - ඩිජිටල් අනන්‍යතා පද්ධතියක් ස්ථාපිත කිරීම. | 2021-2024 | 14000.00 | 92.00 | 15% | ප්‍රධාන පද්ධති ඒකාබද්ධ කිරීමේ ආයතනයක් (Master System Integrator - MSI) ප්‍රසම්පාදන කටයුතු දැනට සිදු කරමින් පවතී . අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ eNIC ව්‍යාපෘතිය සමඟ සහයෝගයෙන් SLUDI ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන ඇත |

| අනු/ | ව්‍යාපෘති නාමය | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | සමස්ත ඇස්තමේන්තු ගත පිරිවැය (TEC) (රු. මි.) | සමුච්චිත වියදම (රු. මි) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය (%) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 3 | ලංකා රාජ්‍ය ජාලය (LGN) – 2.0<br><br>Lanka Government Network (LGN) – 2.0 | රජයේ ආයතන ඒකල ඩිජිටල් යටිතල පහසුකමකට (Single Digital Infrastructure) සම්බන්ධ කිරීම සඳහා මධ්‍යගතව කළමනාකරණය කරන ආරක්ෂිත රජයේ ජාලයක් (VPN) ක්‍රියාත්මක කිරීම. | 2016-2018 (Annual support and maintenance) | 12,737.29 | 9,181.49 | 100% | 2018 අගෝස්තු වන විට රජයේ ආයතන 860ක් සම්බන්ධ කර ඇත.(අවසාන සැතපුම් සම්බන්ධතාව 100Mbps දක්වා සහ Wi-Fi පහසුකම්). මෙහෙයුම් සහ නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතී. |
| 4 | ලංකා රාජ්‍ය මේඝය 2.0 (LGC 2.0)<br><br>Lanka Government Cloud (LGC) – 2.0 | වැඩිදියුණු කළ වලාකුළු යටිතල පහසුකම (Cloud Infrastructure) ස්ථාපිත කිරීම තුළින් රජයේ සන්නිවේදනය ව්‍යාප්ත කිරීම. | 2016-2018 (Support and maintenance annually) | 2,449.50 | 976.47 | 100% | 2018 අගෝස්තු මස සිට ස්ථාපිත කර ක්‍රියාත්මක වෙමින් පවතී. එහි සමස්ත සේවා ආයතන සංඛ්‍යාව 219කි.<br><br>LGC හි විෂය පථය, සේවා ආකෘතිය සහ මිලකරණ ආකෘතිය වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇත. |
| 5 | DigiEcon ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සහ ප්‍රදර්ශනය<br><br>DigiEcon International Conference and Exhibition | දේශීයව සහ ජාත්‍යන්තරව නව්‍ය තොරතුරු තාක්ෂණ ආශ්‍රිත නිෂ්පාදන සහ සේවා විදහා දැක්වීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉහළ නැංවීමට නවීන තාක්ෂණයන් අනෙකුත් ප්‍රධාන අංශවලට සහාය විය හැකි ආකාරය පෙන්නුම් කිරීම. | 2024 | 20.00 | 17.80 | 100% | 2024 ජූනි 25 වන දින ගෝලීය ඩිජිටල් ආයෝජන සමුළුව පැවැත්විණි. එය නවෝත්පාදන කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ හැකියාවන් ප්‍රදර්ශනය කළ අතර, මෙම රට ඩිජිටල් අනාගතයක් කරා මෙහෙයවමින් තිරසාර සංවර්ධනය සඳහා හිතකර පරිසරයක් පෝෂණය කිරීමට ඇති කැපවීම ඉස්මතු කරන ලදී. |

## 2.2 ප්‍රතිපත්ති සහ උපායමාර්ගික මුලපිරීම්

ශ්‍රී ලංකා රජය, රටේ මෑතකාලීන ආර්ථික පසුබෑම් නොතකා, ඩිජිටල්කරණය දියුණු කිරීමට, ඩිජිටල් ආර්ථිකයක් ඇති කිරීම සහ කෘත්‍රිම බුද්ධි කර්මාන්තය වර්ධනය කිරීමට පුළුල් ප්‍රතිපත්ති රාමුවක් සකස් කර ඇති අතර, එමඟින් රට ඩිජිටල් නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය සඳහා තරඟකාරී කලාපීය සහ ගෝලීය කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කිරීම අරමුණු කරයි.

### *2.2.1 ජාතික ඩිජිටල් ආර්ථික උපායමාර්ගය*

"ජාතික ඩිජිටල් ආර්ථික උපායමාර්ගය" සියලුම අංශ තුළ ඩිජිටල් පරිවර්තනය ඇති කිරීම සඳහා මාර්ග සිතියමක් ලෙස ක්‍රියා කරයි. ආර්ථික තරඟකාරිත්වය, ඵලදායී නිෂ්පාදනය, තිරසාර සංවර්ධනය සහ කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ශක්තිමත් ඩිජිටල් පරිසර පද්ධතියක් සංවර්ධනය කිරීම එහිදී අවධාරණය කෙරේ. යටිතල පහසුකම් සංවර්ධනය, ඩිජිටල් නිපුණතා වැඩි දියුණු කිරීම, පාලනය, සයිබර් ආරක්ෂාව, මූල්‍ය ඇතුළත් කිරීම (financial inclusion) සහ අංශමය වශයෙන් නවෝත්පාදන ප්‍රවර්ධනය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර මෙම උපායමාර්ගය මගින් දක්වයි. මෙයට 2024.03.25 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

ඩිජිටල් උපායමාර්ගයට අනුකූල කෘතිම බුද්ධිය (AI), යන්ත්‍ර ඉගෙනීම (ML), සහ අන්තර්ජාලය හා සම්බන්ධ උපාංග (IoT) වැනි නව තාක්ෂණයන් ඒකාබද්ධ කිරීමෙන්, ශ්‍රී ලංකාව සමාජ සාධාරණත්වය සහ පාරිසරික තිරසාරත්වය ප්‍රවර්ධනය කරමින් ආර්ථික තරඟකාරිත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කරයි. එහිදී මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය, ඩිජිටල් ආර්ථික උපායමාර්ගය සහ වත්මන් පාලක පක්ෂය වන ජාතික ජන බලවේගයේ (NPP) 'DoIT 5.0 ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්තිය' සළකා බැලේ. මෙම සියලුම ලේඛන මගින් කර්මාන්තයේ, ශ්‍රම බලකායේ සහ අනෙකුත් සක්‍රීය සාධකවල ප්‍රධාන ඌණතා හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාව සඳහා NPP හි ඩිජිටල් ප්‍රතිපත්තිය වන "DOIT 5.0", නව රජයේ ඩිජිටල් ප්‍රතිපත්තියට දායක වී ඇති අතර, ප්‍රධාන ඉලක්ක හතරක් කෙරෙහි අවධානය යොමු කරයි:

- ඩිජිටල් කර්මාන්තය සංවර්ධනය කිරීම
- පාරදෘශ්‍ය සහ කාර්යක්ෂම පාලනය
- ඩිජිටල් ආර්ථිකය මෙහෙයවීම
- උපායමාර්ගික කර්මාන්ත සහ ක්‍රීඩා සංවර්ධනයට සහාය වීම

මේ අනුව ඩිජිටල් ආර්ථිකයේ ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් කෙරෙහි අවධානය යොමු කරනු ඇත. ඒවා නම් වසර (06) තුළ තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් බවට පත් කිරීම, දූෂණය අවම කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික පාලනය ක්‍රියාත්මක කිරීම, වසර හයක් තුළ නෝට්ටු/කාසි රහිත ගනුදෙනු ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 3.5 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 15 දක්වා වැඩි කිරීම සහ වසර හයක් තුළ තොරතුරු තාක්ෂණ ශ්‍රම බලකාය වාර්ෂිකව 85,000 සිට 200,000 දක්වා වැඩි කිරීම වේ.

මෙම ප්‍රධාන ක්ෂේත්‍රවලට සම්බන්ධ උපායමාර්ගික ක්‍රියාකාරී අයිතම, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සහ එහි අධීක්ෂණය යටතේ ඇති ආයතන මගින් සහ රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලබන අතර, ප්‍රතිඵල ලබා ගැනීම වේගවත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය සහ ආයතනික රාමුව දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

### 2.2.2 කෘත්‍රිම බුද්ධිය (AI) පිළිබඳ ජාතික උපායමාර්ගය

ඩිජිටල් ආර්ථික උපායමාර්ගයට අනුපූරකයක් ලෙස, ශ්‍රී ලංකාව සියල්ලන් ඇතුළත් වර්ධනය සහ සමාජමය ප්‍රතිලාභ සඳහා AI උපයෝගී කර ගැනීම සඳහා "කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ජාතික උපායමාර්ගයක්" හඳුන්වා දී ඇත. මෙම උපායමාර්ගය පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරයි:

- AI සංවර්ධනය සඳහා ඵලදායී සහ ආරක්ෂිත දත්ත භාවිතය සක්‍රීය කිරීම සඳහා දත්ත හුවමාරු යාන්ත්‍රණ, විවෘත දත්ත වේදිකා සහ දත්ත කළමනාකරණය සහ ආරක්ෂාව සඳහා මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම.
- අධ්‍යයන විෂයමාලා යාවත්කාලීන කිරීම සහ ඉලක්කගත පුහුණුවක් ලබා දීමෙන් AI-පාදක ආර්ථිකයක සමෘද්ධිමත් වීමට සිසුන්ට සහ වෘත්තිකයන්ට නිපුණතා ලබා දීම.
- ඉහළ වේගයකින් සම්බන්ධතා පුළුල් කිරීම සහ හවුල් AI වේදිකා සංවර්ධනය කිරීම ඇතුළුව, ඉහළ තාක්ෂණයෙන් යුතු AI යෙදුම් සඳහා සහය දැක්වීම සඳහා ආරක්ෂිත, විසාරණය කළ හැකි සහ තිරසාර ඩිජිටල් සහ දත්ත යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම.
- විශේෂයෙන් සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, කෘෂිකර්මය සහ රාජ්‍ය සේවා සැපයීම වැනි අංශවල උපායමාර්ගික අරමුදල්, සහයෝගීතා වේදිකා සහ ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම් හරහා අවශ්‍යතා මත පදනම් වූ AI පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- AI පිළිබඳ අවබෝධය සහ මහජන දැනුවත්භාවය වැඩි කිරීම සඳහා උපායමාර්ගික සන්නිවේදන සහ අධ්‍යාපන මුලපිරීම් හරහා AI සංකීර්ණ නොවන සරල කිරීම සහ විශ්වාසය ගොඩනැගීම.

මෙම උපායමාර්ගය නවෝත්පාදනය සහ ආර්ථික වර්ධනය මෙහෙයවීම සඳහා වගකිවයුතු රාජ්‍ය අංශයේ පරිවර්තනය සහ පෞද්ගලික අංශයේ AI සම්බන්ධ දිරිගැන්වීම අවධාරණය කරයි.

### 2.2.3 අනෙකුත් ප්‍රතිපත්ති මුලපිරීම්

2024 වර්ෂය තුළ පහත ප්‍රතිපත්ති කෙටුම්පත් කර ඇති අතර පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර ඉක්මනින් අවසන් කිරීමට නියමිතය.

- ඉ-තැපැල් (Email) ප්‍රතිපත්තිය
- මේඝය (ක්ලවුඩ්/ Cloud) ප්‍රතිපත්තිය
- දත්ත බෙදාහදා ගැනීමේ (Data Sharing) ප්‍රතිපත්තිය

## 2.3 මෑත කාලීන වර්ධනයන්

ශ්‍රී ලාංකිකයන්ගෙන් 64% ක් ඩිජිටල් සාක්ෂරතාවයෙන් යුක්ත බව තක්සේරු කර ඇති අතර, එම නිසා ඩිජිටල් විසඳුම් සහ සහායක යටිතල පහසුකම් සඳහා ඇති ඉල්ලුම සීඝ්‍රයෙන් වර්ධනය වේ. එබැවින්, අධිවේගී බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතාවයේ සිට ඩිජිටල් අනන්‍යතාවය දක්වා වූ මූලික යටිතල පහසුකම් අවශ්‍ය වේ. ඩිජිටල් යටිතල පහසුකම් මත සිදු කරන ආයෝජන තිරසාර කිරීම සඳහා ඩිජිටල් යටිතල පහසුකම් සහ මානව සම්පත් ධාරිතා වර්ධනය වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකාව සැලකිය යුතු පියවර ගෙන ඇත.

**SLUDI/eNIC:** ඉන්දියානු රජයේ මූල්‍ය ප්‍රදානයකින් ද සහාය වන MOSIP වේදිකාව භාවිතා කරමින් විද්‍යුත් ජාතික හැඳුනුම්පත (e-NIC) ව්‍යාපෘතිය සමඟ ශ්‍රී ලංකාවේ අද්විතීය ඩිජිටල් අනන්‍යතා මුලපිරීම වේගවත් කිරීම සඳහා රජය විසින් පුළුල් ප්‍රතිපත්තිමය සහ තාක්ෂණික ප්‍රවේශයක් හඳුන්වා දී ඇත.

**ඩිජිටල් රාජ්‍ය යටිතල පහසුකම් (Digital Public Infrastructure) සහ කෘෂි තාක්ෂණය:** ගේට්ස් පදනම සහ තවත් බොහෝ සංවර්ධන ආයතනවල සහාය ඇතිව දැනට කෘෂිකාර්මික අංශය සඳහා ඩිජිටල් රාජ්‍ය යටිතල පහසුකම් (DPI) ස්ථාපිත කිරීමේ ගමනක ශ්‍රී ලංකාව නිරතව සිටී. සමාජ ආර්ථික බලපෑමක් ඇති කරමින් රජයට සහ ගොවීන්ට තීරණ ගැනීමේ සහාය ලබා දෙන තීරණ සහායක පද්ධතියකට සම්බන්ධ වූ වේගවත් ආරම්භක හරහා නවතම තාක්ෂණයන් ඇතුළත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

දත්ත විශ්ලේෂණ සමඟ සංවේදක සහ රූප තාක්ෂණය ඇතුළත් අති නවීන කෘෂි තාක්ෂණ වේදිකාවක් සාක්ෂි මත පදනම් වූ ගොවිතැන් තීරණ ගැනීමට ඉඩ සලසයි. ඉල්ලුම් සැපයුම් සමතුලිතතාවය සහ පොහොර සහ ජලය ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම වඩා හොඳ ගොවිතැන් පිළිවෙත් ඇති කිරීමට සහ අඩු වියදමකින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට ඉඩ සලසයි.

**ස්ටාර්ලින්ක් (Stralink in Sri Lanka**: මෑතකදී, ස්ටාර්ලින්ක් හට ශ්‍රී ලංකාවේ සේවා සැපයීමට බලපත්‍ර ලබා දෙන ලදී. මෙම පියවර මගින් විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල අන්තර්ජාල සේවා වැඩිදියුණු කිරීමට සහ ශ්‍රී ලංකාවේ අභිලාෂකාමී ඩිජිටල්කරණ ක්‍රියාත්මක කිරීම වර්ධනය කිරීමට අරමුණු කරයි.

## 2.4 අමාත්‍යාංශයේ අනාගත සැලසුම

**2025 වර්ෂයේදී නව ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන ඇත.**

### (a) ජාතික දත්ත හුවමාරුව (NDX)

ජාතික දත්ත හුවමාරුව (NDX) යනු විවිධ අංශවල රජයේ ආයතන සහ පාර්ශවකරුවන් අතර ආරක්ෂිත දත්ත හුවමාරුව සහ ඒකාබද්ධ කිරීම පහසු කිරීම සඳහා නිර්මාණය කර ඇති යෝජිත මධ්‍යගත වේදිකාවකි. සම්බන්ධිත රජයේ රාමුවක් තුළ දත්ත හුවමාරුව සඳහා ප්‍රමිතිගත රාමු ස්ථාපිත කිරීමෙන් කාර්යක්ෂම සහයෝගීතාවය, දැනුවත් තීරණ ගැනීම සහ වැඩිදියුණු කළ සේවා සැපයීම සක්‍රීය කිරීම එහි අරමුණයි. අංශ විශේෂිත සැලසුම් සකස් කිරීමට පියවර ගෙන ඇති අතර මෙය අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට (NPD) යෝජනාව ඉදිරිපත් කර ඇත.

### (b) ඩිජිලොකර් DigiLocker

ඩිජිටල් ආර්ථික උපායමාර්ගයට 2030 අනුකූලව, ශ්‍රී ලංකා රජය ඩිජිලොකර් හඳුන්වා දීමට සැලසුම් කර ඇති අතර එය ලේඛන ප්‍රවේශය, ගබඩා කිරීම, බෙදාගැනීම සහ සත්‍යාපනය සඳහා ආරක්ෂිත, ඩිජිටල් බල ගැන් වූ දේශයක් සඳහා වූ මේඝය (Cloud) මත පදනම් වූ වේදිකාවකි . මෙම මුලපිරීම ශ්‍රී ලංකාවට හඳුන්වා දීම සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය ඉන්දියානු රජයේ ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඇත. මෙම යෝජනාව අනුමැතිය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට (NPD) යොමු කර ඇත.

### (c) ඩිජිටල් ආර්ථික අධිකාරිය (DEA) පිහිටුවීම

ඩිජිටල් ආර්ථිකය තවදුරටත් වේගවත් කිරීම සඳහා නව නීති සම්පාදනය කිරීමට සහ ඩිජිටල් පරිසර පද්ධතිය තුළ ඩිජිටල් ආර්ථික අධිකාරිය (DEA) ඇතුළු නව ආයතනික යාන්ත්‍රණයක් සහ අනෙකුත් විෂය විශේෂිත ආයතන ස්ථාපිත කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන ඇත. ICTA වෙනුවට DEA නිර්මාණය කිරීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති අතර, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යටතේ අන්තර්කාලීනව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) ද ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

## 2.5 ඩිජිටල්කරණය සඳහා මූල්‍ය පහසුකම්

2025 වර්ෂය සඳහා අමාත්‍යාංශයට වෙන් කරන ලද අතිරේක රුපියල් බිලියන 3 යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා පහත වැඩසටහන්, ව්‍යාපෘති සහ මුලපිරීම් හඳුනාගෙන ඇත. ඊට අමතරව, ඉදිරි වසර තුන තුළ ඩිජිටල් ආර්ථික මුලපිරීම් වේගවත් කිරීම සඳහා ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික මූල්‍ය සහ තාක්ෂණික සහයෝගීතාවන් කිහිපයක් සිදුවෙමින් පවතී.

| වැඩසටහන් / ව්‍යාපෘති / මුල පිරීම් | අනුමත ප්‍රතිපාදන (රු.මි.) |
|---|---|
| 1. ජාතික දත්ත හුවමාරුව (NDX) | 300.00 |
| 2. ශ්‍රම බලකාය සංවර්ධනය | 300.00 |
| 3. ඩිජිටල් ආර්ථික අධිකාරිය (DEA) | 500.00 |
| 4. ආරම්භක අරමුදල් අරමුදල් වැඩසටහන | 300.00 |
| 5. අනිෂ්ට මෘදුකාංග විශ්ලේෂණ සහ තර්ජන හඹා යාමේ ව්‍යාපෘතිය | 275.00 |
| 6. භෞමික රූපවාහිනී විකාශනයේ ඩිජිටල්කරණය (DTTB) | 125.00 |
| 7. ජාතික කෘතිම බුද්ධි ධාවනය | 750.00 |
| 8. ලංකා QR සහ GovPay වැඩසටහන | 200.00 |
| 9. රාජ්‍ය අංශයේ නිල විද්‍යුත් තැපැල් ධාවනය - පළමු අදියර | 50.00 |
| 10. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමණාකරන ඒකකය | 100.00 |
| 11. DigiLocker | 100.00 |
| **එකතුව** | **3000.00** |

තවද, 2025 වර්ෂයේ අමාත්‍යාංශයට වෙන් කරන ලද රුපියල් බිලියන 1.5 ක සාමාන්‍ය අයවැය යටතේ පහත මුලපිරීම් ක්‍රියාත්මක කරනු ලැබේ.

| **වැඩසටහන / ව්‍යාපෘතිය / මුලපිරීම** | **ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රුපියල් මිලියන)** |
|---|---|
| 1. සයිබර් ආරක්ෂණ නියාමන අධිකාරිය (CSRA) පිහිටුවීම | 500.00 |
| 2. වෙනත් රජයේ ආයතන ඉදිරිපත් කරන ලද ඩිජිටල් සංවර්ධන ඉල්ලීම් | 1,000.00 |
| මුළු එකතුව | 1,500.00 |

## 2.6 භෞමික රූපවාහිනී විකාශන (DTTB) ව්‍යාපෘතිය

JICA මෘදු ණය යටතේ බොහෝ ප්‍රමාද වූ ව්‍යාපෘතිය වේගවත් කිරීමට රජය තීරණය කළේය. ඩිජිටල් භෞමික රූපවාහිනී විකාශන (DTTB) ව්‍යාපෘතිය අවසන් වූ පසු මෙම කලාප පළල නිදහස් වූ පසු රූපවාහිනී ක්‍රියාකරුවන් විසින් අත්පත් කරගෙන ඇති 700 MHz කලාප පළල TRCSL හට නිදහස් කිරීමට හැකි වනු ඇත. මෙය විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශ සඳහා බ්‍රෝඩ්බෑන්ඩ් පහසුකම් පුළුල් කිරීමට සහ රටේ ඩිජිටල්කරණ ප්‍රයත්නයන්ට සහාය වීම සඳහා 5G ප්‍රවර්ධනය කිරීමට උපකාරී වේ. කොළඹ නෙළුම් කුළුණේ ඉහළම ඇන්ටෙනා ආවරණය DTTB සම්ප්‍රේෂණය මගින් ප්‍රශස්ත කළ හැක. 5G වර්ණාවලිය පුළුල් කිරීම නව කාර්මික අවස්ථා ද විවෘත කරයි.

## 2.7 ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සබඳතා

**චීනය සමඟ හවුල්කාරිත්වය:** චීනයේ 'බෙල්ට් ඇන්ඩ් රෝඩ් මුලපිරීම' ශ්‍රී ලංකාවේ 2030 ඩිජිටල් ආර්ථික සැලැස්ම සමඟ පෙළගැස්වීම ඇතුළුව වැඩි ආයෝජන සහ ආර්ථික සහයෝගීතාවයකට ශ්‍රී ලංකාව සහ චීනය එකඟ වී ඇත. මෙම හවුල්කාරිත්වය යටිතල පහසුකම් සංවර්ධනය සහ තාක්ෂණික සහයෝගීතාවය හරහා ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ඉන්දියාව සමඟ හවුල්කාරිත්වය**: ඩිජිටල් පරිවර්තනය සඳහා ජනගහන පරිමාණයෙන් ක්‍රියාත්මක කරන ලද සාර්ථක ඩිජිටල් විසඳුම් බෙදාගැනීමේ ක්ෂේත්‍රයේ සහයෝගීතාව සඳහා අවබෝධතා ගිවිසුමක් අවසන් කර ඇති අතර එය ඉක්මනින් අත්සන් කරනු ලැබේ.

**එක්සත් ජාතීන්ගේ ආයතන:** ශ්‍රී ලංකාවේ සිවිල් ලියාපදිංචිය සහ ජීව දත්ත සංඛ්‍යාලේඛන (CRVS) ව්‍යාපෘතියක් දැන් එක්සත් ජාතීන්ගේ SDG අරමුදල හරහා මූල්‍යනය කරනු ලබන අතර, WHO සමඟ UNDP රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට පුද්ගලයන්ගේ බෙදාගත හැකි ඩිජිටල් දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීමට සහාය වේ.

## 2.8 ගෝලීය ව්‍යාපාරික නායකයින් සමඟ සම්බන්ධ වීම

ගරු ජනාධිපතිතුමන් මෑතක දී සිදු කරන ලද ඩුබායි නිල සංචාරයේදී, ඔහු ගෝලීය ඉල්ලුම සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ පර්යේෂණ හා සංවර්ධන, සංවර්ධන සහ අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටුවීමට ගෝලීය සමාගම් කිහිපයකට ආරාධනා කළේය. නව රජය 2030 වන විට ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ශ්‍රම බලකාය 85,000 සිට 200,000 දක්වා වැඩි කිරීමට කැප වී සිටින අතර, මෙම ඉල්ලුම් සපුරාලීම සඳහා ශ්‍රම බලකාය සංවර්ධනයට එමගින් රුකුලක් ලැබේ.

මෙහි දී ගරු ජනාධිපතිතුමන් විසින් Oracle උප සභාපතිගෙන් ශ්‍රී ලංකාවේ Oracle AI සහ ක්ලවුඩ් නවෝත්පාදන මධ්‍යස්ථානයක් (Cloud Innovation Hub)ස්ථාපිත කිරීම, රජය සහ බැංකු සඳහා Oracle යටිතල පහසුකම් ඇති කිරීම සහ රාජ්‍ය අංශයේ ඩිජිටල් පරිවර්තනය සක්‍රීය කිරීමට ඉල්ලීමක් කර ඇත.

ශ්‍රී ලංකාව දේශපාලනික වශයෙන් මධ්‍යස්ථ ස්ථාවරයක සිටින බැවින්, ගෝලීය ව්‍යවසායකයින්ට එක් මධ්‍යස්ථානයක සිට දකුණු ආසියාවේ (ඉන්දියාව, පකිස්ථානය, බංග්ලාදේශය, නේපාලය) රටවල් සඳහා සේවය සැපයීමට ඉඩ සලසයි. ඉහළ නිපුණතා සහිත, ලාභදායී දක්ෂතා සහ දිරිගැන්වීම් සහිත විශේෂිත ආර්ථික කලාප (SEZ) තිබීම මෙම කලාපයේ AI, cloud computing සහ ඩිජිටල් පරිවර්තනය සඳහා කදිම පදනමක් බවට ශ්‍රී ලංකාව පත් කළ හැකිය.

දකුණු ආසියාවේ වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කරමින්, Daraz ස්ථානගත කිරීම, කොළඹ වරාය නගර (Port City) SEZ සහ හම්බන්තොට ප්‍රාදේශීය විද්‍යුත් වාණිජ්‍යය සහ සැපයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීමට Alibaba සමාගමේ සභාපති වෙතින් මෙහි දී ඉල්ලීමක් කර ඇත.

Roblox හි ප්‍රධාන විධායක නිලධාරී David Baszucki සමඟ පැවති හමුවේදී, දකුණු ආසියාවේ සහ ගෝලීය දෙමළ ඩයස්පෝරාව සඳහා දෙමළ භාෂා අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කළ විශේෂිත ඒකකයක් සමඟ යාපනයේ ගෝලීය Roblox ක්‍රීඩා සංවර්ධන සහ ඩිජිටල් නිර්මාණශීලීතා මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලෙස ජනාධිපතිතුමන් ඉල්ලා සිටින ලදි.

# පරිච්ඡේදය 03 - 2024 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය - ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

+

ඒසීඒ-එෆ්

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 | | සටහන | සත්‍ය 2024 | සත්‍ය 2023 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| 20,400,000,000 | ආදායම් ලැබීම් | | 18,222,160,662 | 19,182,056,557 | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| 20,400,000,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 18,211,160,662 | 19,182,056,557 | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 11,000,000 | - | |
| **20,400,000,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **18,222,160,662** | **19,182,056,557** | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 3,996,041,000 | 2,201,309,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 13,892,817 | 13,286,624 | ඒසීඒ-4 |
| 800,000 | අත්තිකාරම් ගිණුම් | | 2,435,972 | 1,674,236 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| **800,000** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **4,012,369,789** | **2,216,269,860** | |
| **20,400,800,000** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **22,234,530,451** | **21,398,326,417** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 11,955,539 | - | |
| **20,400,800,000** | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **22,222,574,912** | **21,398,326,417** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 71,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිල | 5 | 48,948,946 | 42,017,327 | |
| 3,010,390,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 2,924,200,438 | 1,252,018,412 | ඒසීඒ-2(ii) |
| 497,010,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 476,894,752 | 578,906,778 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **3,578,400,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **3,450,044,136** | **1,872,942,517** | |
| | **මූලධන වියදම්** | | | | |
| 9,900,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 1,610,609 | 6,695,156 | |
| 34,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 8,733,669 | 2,575,593 | |
| 200,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 53,990,972 | 319,608,621 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | - | - | |
| 2,500,000 | හැකියා වර්ධනය | 14 | 312,390 | 425,500 | |
| 5,110,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 897,125,432 | 83,800 | |
| **5,356,400,000.00** | **මුළු මූලධන වියදම් (උ)** | | **961,773,072** | **329,388,669** | |
| | තැන්පතු ගෙවීම් | | 13,271,720 | 13,032,721 | ඒසීඒ-4 |
| 6,000,000.00 | අත්තිකාරම් ගෙවීම් | | 4,393,022 | 1,861,617 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| **6,000,000.00** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **17,664,742** | **14,894,338** | |
| **8,940,800,000** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **4,429,481,950** | **2,217,225,525** | |
| **11,460,000,000** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **17,793,092,962** | **19,181,100,892** | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | 17,793,092,962 | 19,181,100,892 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | 17,793,092,962 | 19,181,100,892 | ඒසීඒ-3 |

ඒසීඒ-පී

## 2024 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තතය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 39,282,273 | 36,810,333 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 10,744,412 | 8,787,363 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **50,026,685** | **45,597,696** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 4,586,972 | 3,251,019 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 39,282,273 | 36,810,333 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | 5,257,440 | 5,257,440 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 900,000 | 278,903 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **50,026,685** | **45,597,696** |

පිටු අංක…06..සිට ..40.. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..41.. සිට ..47..දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ………………………… | ……………… | ………………………………………… |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2025/02/25 | දිනය : | දිනය : 2025-02-25 |

වරුණ ශ්‍රී ධනපාල
ලේකම් (වැ.බ)
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

කේ.ඩී. දිලීපා රත්නායක
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 3,247,406 | 1,648,447 |
| අග්‍රිම ලැබීම් | | 3,996,041,000 | 2,201,309,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 2,629,457 | 1,735,853 |
| තැන්පතු ලැබීම් | | 13,892,817 | 13,286,624 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **4,015,810,680** | **2,217,979,925** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 2,972,981,884 | 1,293,794,639 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 476,894,752 | 578,906,778 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 188,533 | 995,500 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 11,955,539 | 6,500,000 |
| අත්තිකාරම් ගෙවීම් | | 4,393,022 | 1,861,617 |
| තැන්පතු ගෙවීම් | | 13,271,720 | 13,032,721 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **3,479,685,450** | **1,895,091,255** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **536,125,230** | **322,888,669** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | **-** | **-** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | | |
| මූලධන වියදම් | | 547,125,230 | 329,388,669 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **547,125,230** | **329,388,669** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | **(547,125,230)** | **(329,388,669)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | **(11,000,000)** | **(6,500,000)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | 11,000,000 | 6,500,000 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | **11,000,000** | **6,500,000** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | **11,000,000** | **6,500,000** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | - | - |

### 3.2 මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

නැත.

### 3.3 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| ආදායම් සංකේතය | ආදායම් සංකේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | රැස් කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මූලික | අවසන් | ප්‍රමාණය (රු.) | අවසන් ආදායම් ඇස්තමේන්තු වේ % ක් ලෙස |
| 1002.11.00 | දුරකතන ග්‍රාහක බද්ද | 18,500,000,000 | 18,500,000,000 | 15,927,326,276 | 86.09% |
| 1002.14.00 | ජංගම දුරකථන සන්නිවේදන කුළුණු බද්ද | 1,600,000,000 | 1,600,000,000 | 1,685,680,675 | 105.35% |
| 1002.15.00 | කෙටි වෙළඳ පණිවිඩ බද්ද | 300,000,000 | 300,000,000 | 598,153,711 | 199.38% |

### 3.4 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | ප්‍රතිපාදන වෙන් කිරීමේ උපයෝජනය අවසාන ප්‍රතිපාදනය වෙන් කිරීමේ % ක් ලෙස |
|---|---|---|---|---|
| | මුල් | අවසාන | | |
| පුනරාවර්තන | 2,869,000,000 | 3,383,000,000 | 3,327,649,825 | 98.36% |
| ප්‍රාග්ධන | 5,340,000,000 | 5,340,000,000 | 958,284,019 | 17.94% |

### 3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2024.12.31 දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය | 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය (රු.) | ගණන් ගත යුතු | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ සහ උපකරණ | - | 39,282,272.90 | - | - |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | වැඩ කිරීමේ ප්‍රගතිය | - | - | - | - |
| 9180 | වත්කම් බදු දීම | - | - | - | - |

## 3.6 අභ්‍යන්තර විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAM/E/MDE/02/24/07 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි 29 දින

ලේකම්
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

**ශීර්ෂය 186 - ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ජී.එච්.අයි. වින්දයා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්,රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

CAM/E/MDE/02/24/07 2025 මැයි 29 දින

ලේකම්
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

**ශීර්ෂය 186 - ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** මතය

ශීර්ෂය 186 - ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින්

2

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

(අ) රු. 508,000,000 ක පරිපූරක ප්‍රතිපාදන හා මු.රෙ. 66 යටතේ රු. 444,700,000 ක් ප්‍රතිපාදන මාරු කිරීම් කරන ලද වැය විෂය 03 ක රු. 45,585,108 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) මු.රෙ. 50 අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන්ම නිවැරදිව සකසුරුවම හා කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් සකස් කළ යුතු බව දක්වා තිබියදී අමාත්‍යාංශය විසින් සකස් කළ වියදම් ඇස්තමේන්තුව අනුව අධි ප්‍රතිපාදන ලබාගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 12 ක හා මූලධන වැය විෂයයන් 08 ක එකතුව රු. 4,461,075,919 ක් ඉතිරි වී තිබුණු අතර එය සියයට 30 සිට සියයට 100 ක පරාසයක් දක්වා විහිදී තිබුණි.

### 3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024(12) අනුව සියළු බැදීම් හා බැරකම් නිසි පරිදි ඒකාබද්ධ කර භාණ්ඩාගාර තොරතුරු පද්ධතිය හා නව සිගාස් ගිණුම් තොරතුරු පද්ධතිය හරහා භාණ්ඩාගාරය වෙත වාර්තා කළ යුතු ලෙස දක්වා ඇති නමුත් රු. 324,471,887 ක බැරකම් හඳුනාගෙන නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව බැදීම් හා බැරකම් සඳහා එළඹිය යුතු වුවද ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් වැය විෂය අංක 1409 හි ප්‍රතිපාදන ඉක්මවා රු. 140,760,955 ක බැදීම් හා බැරකම්වලට එළඹී තිබුණි.

4

179

(ඇ) වවුචර් අංක 2501/23 යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත රු. 9,596,543 ක වටිනාකමක් ගෙවා තිබුණද රු. 7,203,934 ක් පමණක් බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි.

### 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලැසුම් කිරීම

(අ) ක්‍රියාකාරී සැලැස්ම හා අනුරූප භෞතික ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති 24 ක් සම්පූර්ණයෙන් නිම කිරීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘති 08 ක් පමණක් නිමකර තිබුණි.

(ආ) 2023 වර්ෂයේ ආරම්භ කර 2024 මාර්තු 31 දිනට නිම කිරීම සඳහා සැලසුම් කළ විද්‍යුත් ගෙවීම් පද්ධති (GOVPAY) ව්‍යාපෘතියට 2024 වර්ෂයේ රු. මිලියන 200 ක ප්‍රතිපාදන ඇස්තමේන්තු කර ඇතත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු. 89,000 ක වියදමක් පමණක් දරා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා පරිගණක හා හදිසි ප්‍රතිචාර සංසදයට (SLCERT) ව්‍යාපෘති 11 ක් සඳහා රු. මිලියන 531.95 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් රු. මිලියන 510.48 ක් වැය කර තිබුණි. ඉහත ව්‍යාපෘති 11 ම 2024 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණු නමුත් ඉන් ව්‍යාපෘති 04ක් පමණක් නිමකර තිබුණු අතර තවත් ව්‍යාපෘති 02 ක් මූලික අදියරවල පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) Elevating CERT Technical Operational HR Proficiency of CERT ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 32 ක් වන අතර 2024 වර්ෂයේ ප්‍රතිපාදන ලෙස රු. මිලියන 38.5 ක් එනම් ඇස්තමේන්තු ගත වියදමට වඩා වැඩි මුදලක් වෙන්කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 35.6 ක් වැයකර ඇතත් එහි භෞතික ප්‍රගතිය සියයට 70 ක් විය.

(ඉ) ඩිජිටල් ආර්ථිකයක් සඳහා තාක්ෂණ විසරණය (Technology Diffusion Program) ව්‍යාපෘතිය රු. මිලියන 1002 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ 2021 වර්ෂයේ ආරම්භ කර 2024 වර්ෂයේ නිම කිරීමේ අරමුණින් 2024 වර්ෂය සඳහා රු. මිලියන 27 ක ප්‍රතිපාදන වාර්ෂික අයවැය තුළින් වෙන් කර ඇති මුත් සමාලෝචිත වර්ෂයේ කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.

(ඊ) ICT Solution for Government Analyst Department (GAD) ව්‍යාපෘතිය රු. මිලියන 40 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ 2016 වර්ෂයේ ආරම්භ කර 2018 වර්ෂය වන විට නිම කිරීමේ අරමුණෙන් ක්‍රියාත්මක කළ ද ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වලින් සියයට 75 ක් සම්පූර්ණ වන විට User Acceptance Testing අදියරේදී එහි නිර්මාණය කරන ලද පද්ධති අයිතමයන් ආයතනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන බව අනාවරණය වීම හේතුවෙන් අතරමඟ අත්හිටුවා තිබුණි. නමුත් 2023 වර්ෂයේ එම අවශ්‍යතාවයන් සියයට 60 ක් සම්පූර්ණ වූ බැවින් KOICA ප්‍රදාන සහය ඇතිව නැවත ක්‍රියාත්මක කිරීම සඳහා 2023 ජූලි මස ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කල්ඉකුත් වූ කොන්ත්‍රාත්තුව අත්සන් කර මෙම ව්‍යාපෘතිය දියත් කිරීමට සැලසුම්කර තිබුණ ද 2024 වර්ෂය අවසානය වන විටත් 2024 වර්ෂයේ පළමු කාර්තු 02 ඇතුළත සම්පූර්ණ කිරීමට තිබූ ඉතිරි සියයට 15 න් සියයට 05 ක භෞතික ප්‍රගතියක් පමණක් වාර්තා වී තිබුණි.

(උ) ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදන ලබාදෙන දත්ත ආරක්ෂණ අධිකාරිය සඳහා 2024 වර්ෂයේ රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර ඇතත් එහි මූල්‍ය ප්‍රගතිය සියයට 6.1 කි. එහි සැලසුම් කළ කාර්යයන්වලට අදාළ 2024 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 වත්කම් කළමනාකරණය

(අ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (SA-82) 2024 දෙසැම්බර් 31 දිනට වෙනත් යන්ත්‍ර හා උපකරණ ශේෂය ලෙස සිගාප් වැඩසටහන තුළ ඇතුළත් ශේෂය හඳුනාගෙන ඇතත් අමාත්‍යාංශය සතුව භෞතිකව පවතින වත්කම් අයිතම 28 ක අගය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය සතුව අංක PF – 2271 හා KJ – 2658 දරන සංචිත වාහන 02 ක් ඇති අතර එම වාහන පිළිවෙලින් මාස 06 ක හා 07 ක පමණ කාලයක සිට උපයෝජනය නොකර නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| සුවිශේෂී දර්ශක | තත්‍ය නිපැයුම අපේක්ෂිත නිපැයුමේ ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|
| | **100%- 90%** | **75%-89%** | **50%- 74%** |
| සයිබර් ආරක්ෂණ පනත් කෙටුම්පත සංවර්ධනය කිරීම | | | * (නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කරන ලදී) |
| ඩිජිටල් ආර්ථික සැලැස්ම සංවර්ධනය කිරීම | | | * |
| රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව (GovPay) – GovPay පද්ධතියේ ආයතන 30 කට සම්බන්ධ වේ. | * (ආයතන 16 ක් ඇතුළත් කර ඇත) | | |
| සයිබර් ආරක්ෂණ උපායමාර්ග සංවර්ධනය (2025-2029) | | * (කෙටුම්පත සකස් කර ඇත) | |

## පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

**5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.**

| අරමුණ / පරමාර්ථය | ඉලක්ක | සාධන දර්ශකය | සාධනයේ මේ දක්වා ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | **0%-49%** | **50%-74%** | **75%-100%** |
| **4 වැනි අරමුණ -** සියළු දෙනාම සඳහා අන්තර්ගත සමාන ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලයටම ඉගෙන ගැනීමේ අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම | 4.4 2030 වසර වනවිට තාක්ෂණික සහ වෘත්තීමය හැකියාවන්, රැකියා සඳහා, සභ්‍ය රැකියා සහ ව්‍යවසායකත්වයන් ඇතුළුව අදාළ හැකියාවන් සහිත තරුණ තරුණියන් සහ වැඩිහිටියන් සංඛ්‍යාව ප්‍රමාණවත් පරිදි ඉහළ නැංවීම | 4.4.1. තොරතුරු හා තාක්ෂණ (ICT) කුසලතා ඇති තරුණ හා වැඩිහිටියන්ගේ අනුපාතය | - | ✓ | - |
| **9. වැනි අරමුණ.** සවිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට ප්‍රවේශවීම සැලකිය යුතු අන්දමින් වැඩි වීම සහ විශ්වීයව හා දැරිය හැකි මිලකට අවම වශයෙන් සංවර්ධනය වි ඇති රටවල අන්තර්ජාල ප්‍රවේශය ලබා දීමට උත්සාහ කිරීම | 9. ඇ. 1. ජංගම ජාල මගින් සහ තාක්ෂණය මගින් ආවරණය වන ජනගහන ප්‍රමාණය | - | ✓ | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| **17 වැනි අරමුණ.** තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාව ක්‍රියාත්මක කිරීමේ ආකාරයන් සවිමත් කිරීම හා පුනර්ජීවනය. | විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදනය සඳහා උතුරු - දකුණු, දකුණු - දකුණු සහ ත්‍රිකෝණාකාර කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගීතාව සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සහ පවතින යාන්ත්‍රණයන් අතර වැඩිදියුණු කරන ලද සම්බන්ධීකරණය මගින් අන්‍යොන්‍ය වශයෙන් එකඟ වන කොන්දේසි මත විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ මට්ටමින් සහ ගෝලීය තාක්ෂණික පහසුකම් යාන්ත්‍රණයක් හරහා දැනුම බෙදා ගැනීම වැඩි දියුණු කිරීම. | 17.6.1 නිවැසියන් 100 කට ස්ථාවර අන්තර්ජාල<br><br>බ්‍රෝඩ්බෑන්ඩ් දායකත්වය | - | ✓ | - |

ඉහත සඳහන් තිරසාර සංවර්ධන ඉලක්ක උපරිම ලෙස සාක්ෂාත් කර ගැනීමට අමාත්‍යාංශය විසින්ම සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන කටයුතු කරමින් සිටී. කාලෝචිත සම්පත් වෙන් කිරීමක් නොමැතිකම සහ දේශපාලන අස්ථාවරත්වය ආශ්‍රිත ගැටළු වැනි බාධක තිබුණද, අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක වලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමේදී සතුටුදායක මට්ටමේ ජයග්‍රහණ ලබා ගත හැකි ය.

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග

**ජයග්‍රහණ**

ඩිජිටල් සාක්ෂරතා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා දිවයින පුරා ICTA, SLCERT, TRCSL සහ SLT මොබිටෙල් විසින් විවිධ ධාරිතා වර්ධන වැඩසටහන්, වැඩමුළු, කණ්ඩායම් කඳවුරු සහ සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ.

**අභියෝග**

I. ග්‍රාමීය සහ අසමාන ආවරණය / ඩිජිටල් බෙදීම (Digital Divide)
II. යටිතල පහසුකම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා ඉහළ පිරිවැය (CAPEX)
III. නියාමන සහ ප්‍රතිපත්ති සීමාවන්
IV. තාක්ෂණය / යටිතල පහසුකම් ගැටළු
V. මූල්‍ය සහ ආර්ථික සීමාවන්
VI. මානව ධාරිතාව, කුසලතා සහ ඩිජිටල් සාක්ෂරතාවය
VII. විශ්වාසය, ආරක්ෂාව, නෛතික / සදාචාරාත්මක ගැටළු
VIII. සම්බන්ධීකරණ ගැටළු සහ රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා බාධක

## පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| අ/අ | ආයතනය | සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | අතිරික්ත | ඇබෑර්තු |
|---|---|---|---|---|---|---|
| 01. | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | ජ්‍යෙෂ්ඨ | 26 | 13 | 0 | 13 |
| | | තෘතීයික | 6 | 0 | 0 | 6 |
| | | ද්විතියික | 42 | 18 | 0 | 24 |
| | | ප්‍රාථමික | 19 | 6 | 0 | 13 |
| | | කොන්ත්‍රාත් | 5 | 0 | 0 | 0 |
| | | තාවකාලික | 1 | 1 | 0 | 0 |
| | | | 94 | 38 | 0 | |

## 6.2 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | මුළු ආයෝජනය (රු. 000) | | වැඩසටහනේ ස්වභාවය (විදේශ/ දේශීය) | ප්‍රතිදානය / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| තාක්ෂණික ආරම්භක පරිසර පද්ධති සංවර්ධනය - ඉන්දුනීසියාව | 1 | දින 7 | 53,555.25 | ✓ | විදේශ | |
| ශ්‍රී ලංකාව සඳහා පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ භාවිතය පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 1 | දින 16 | 115,140.00 | ✓ | විදේශ | |
| ශ්‍රී ලංකා රජය සහ යහපාලනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය අතර ඒකාබද්ධ සහයෝගීතාවයක් | 1 | දින 7 | 77,343.00 | ✓ | විදේශ | |
| ගෝලීය සංවර්ධන මුලපිරීම යටතේ ඩිජිටල් ආර්ථික පාලනය පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 3 | දින 16 | 344,567.82 (114,855.94*3) | ✓ | විදේශ | |
| ගෝලීය සංවර්ධන මුලපිරීමේ වැඩසටහන යටතේ වාණිජ මණ්ඩලය සහ කර්මාන්ත මණ්ඩලය සඳහා ඩිජිටල් ආර්ථිකය සහ කාර්මික වැඩිදියුණු කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 1 | දින 17 | 116,276.25 | ✓ | විදේශ | |
| DPGA වාර්ෂික සාමාජික රැස්වීම 2024 - සිංගප්පූරුව | 1 | දින 4 | 22,256.25 | ✓ | විදේශ | |
| කාර්මික රුසියානු සමුළුව ඩිජිටල්කරණය - රුසියාව | 1 | දින 7 | 46,207.50 | ✓ | විදේශ | |
| ඩිජිටල් යුගයේ පාලනය | 1 | දින 16 | 115,744.91 | ✓ | විදේශ | |
| ඕස්ට්‍රේලියානු සම්මාන - ඩිජිටල් යුගයේ පාලනය - ඕස්ට්‍රේලියාව | 1 | දින 16 | 145,259.51 | ✓ | විදේශ | |
| ගෝලීය සංවර්ධන මුලපිරීම යටතේ ඩිජිටල් ආර්ථිකය සහ කර්මාන්ත ඒකාබද්ධ කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 1 | දින 16 | 144,891 (123,624.00+ 21,267.00) | ✓ | විදේශ | |
| මයික්‍රොසොෆ්ට් AI සංචාරය | 1 | දින 5 | 32,709.00 | ✓ | විදේශ | |

* විදේශීය පුහුණු වැඩසටහන මඟින් සහභාගිවන්නන්ගේ තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම, ජාත්‍යන්තර හොඳම භාවිතයන් ඔවුන්ට නිරාවරණය කිරීම සහ ඔවුන්ගේ කාර්යයේදී යෙදිය හැකි නව කුසලතා වර්ධනය කිරීම මගින් ඔවුන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කරන ලදී. එය ඔවුන්ගේ ඉදිරිදර්ශනය පුළුල් කිරීම, ගැටළු විසඳීමේ හැකියාවන් ශක්තිමත් කිරීම සහ වෘත්තීය වගකීම් වඩාත් ඵලදායී ලෙස හැසිරවීමේ විශ්වාසය වැඩි කිරීම ද සිදු කළේය.

## පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරනු ලබන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134(2) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | 4 | | . |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අදාළ නොවේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම. | අදාළ නොවේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ පිළිබඳව චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ කටයුතු සිදුකොට තිබීම. | අදාළ නොවේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අදාළ නොවේ | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | සංචිත වාහන නැත | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | සංචිත වාහන නැත. | | |
| 9.3 | වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | සංචිත වාහන නැත. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | සංචිත වාහන නැත. | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අදාල නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බබන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම. | අදාල නොවේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අදාල නොවේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අදාල නොවේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අදාල නොවේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත සේවක සංඛ්‍යා සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇතත්, නිලධාරීන් යොදවා නැත. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරි යකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා ඇත | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 8 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 හි සඳහන් ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘති පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් තළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |

# පරිච්ඡේදය 08 - අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

## 8.1 ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (*SLCERT*)

| අ/අ | ව්‍යාපෘති නාමය | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය (TEC) (රු.මි.) | සමුච්චිත වියදම (රු.මි .) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය (%) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | සයිබර් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (NCSOC)පිහිටුවීම (Establishment of Cyber Security Operations Centre (NCSOC)) | පුරවැසියන්ට ආරක්ෂිත සහ විශ්වාසනීය රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා, රජයේ තීරණාත්මක ජාල සහ පද්ධතිවල ආරක්ෂාව ක්‍රියාශීලීව අධීක්ෂණය කිරීමට ජාතික මට්ටමේ ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක්(SOC) ක්‍රියාත්මක කිරීම. | 2018-2025 | 830.25 | 446.37 | 90% | දෘඩාංග සහ මෘදුකාංග ස්ථාපනය සහ ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සම්පූර්ණ කර ඇත.<br><br>සේවාලාභියකු සම්බන්ධ කර ඇත . 2025 දී සේවාලාභීන් 10ක් සම්බන්ධ කිරීමට අපේක්ෂා කෙරේ. |
| 2 | ජාතික සහතිකකරන අධිකාරිය (National Certificate Authority (NCA)) | ශ්‍රී ලංකාවේ විද්‍යුත් ගනුදෙනු ආරක්ෂිතව සිදු කිරීමට පහසුකම් සැලැස්වීම පිණිස සහතික කිරීමේ සේවා සපයන්නන්ගේ (CSPs) සුමට හා ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය සමස්ත පාලන සහ ප්‍රමිති සැකසීමේ ආයතනය ලෙස NCA ස්ථාපිත කිරීම. | 2019-2025 | 477.69 | 460.47 | 85% | ක්‍රියාකාරීත්වය පිළිබඳ වාර්ෂික විගණනය සම්පූර්ණ කර ඇත.<br><br>යටිතල පහසුකම් ප්‍රසම්පාදනය සිදු කෙරෙමින් ප්‍රගතියේ පැවතුණි. අන්තර්ජාල ප්‍රවේශය (Browser) වෙත මූල සහතික (Root Certificate) සක්‍රිය කිරීමේ ප්‍රගතියක් දක්වා ඇත. විශ්වාසනීයත්වය සහතික කිරීමේ මුද්‍රාව (Web Trust Seal) ලබා ගන්නා ලදී. |

| අ/අ | ව්‍යාපෘති නාමය | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය (TEC) (රු.මි.) | සමුච්චිත වියදම (රු.මි.) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය (%) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 3 | රාජ්‍ය ආයතනවල පද්ධති අවදානම් තක්සේරුව සිදු කිරීම (Risk assessments for government organizations) | සයිබර් පද්ධති ආරක්ෂණය/ අවදානම් තක්සේරු, අවදානම් විශ්ලේෂණ සහ විනිවිද යාමේ පරීක්ෂණ පැවැත්වීම, තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති සහ සම්පාදනයේ අඛණ්ඩතාආපදා ප්‍රතිසාධන / සැලසුම් සංවර්ධනය කිරීම සහ පුහුණුසැසි පැවැත්වීම මගින් රජයේ සංවිධාන 10 ක සයිබර් ආරක්ෂණ සූදානම වැඩි දියුණු කිරීම. | 2020-2024 | 130.00 | 8.56 | 100% | රාජ්‍ය ආයතන 10ක අවදානම් තක්සේරුව සම්පූර්ණ කර ඇත. |
| 4 | සයිබර් ආරක්ෂණය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන (Cyber Security Capacity building program) | පුහුණුකරුවන් පුහුණු සැසි වැඩසටහනක් (ToT) පවත්වා රජයේ සේවකයින් 10,000කට පුහුණුව ලබාදීම. | 2020-2024 | 59.00 | 15.88 | 60% | රාජ්‍ය නිලධාරීන් පුහුණුව ලබා දී ඇති අතර තවත් 3000කට 2025 දී පුහුණුව ලබා දෙනු ඇත. |
| 5 | සයිබර් ආරක්ෂාවට අදාළ නීතිමය ප්‍රතිසංස්කරණ (Legal Reforms on Cyber Security) | සයිබර් ආරක්ෂාව සහතික කිරීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම. | 2024 | 10.00 | 0.18 | 20% | පවතින නීතිමය රාමුවල අඩුපාඩු හඳුනා ගැනීමට සහ නව තාක්ෂණයන්හි අවදානම් විසඳීමට විශේෂඥ මතය ලබා ගැනීම සඳහා පාර්ශ්වකරුවන් සමග උපදේශන වාර පවත්වන ලදී. |

| අ/අ | ව්‍යාපෘති නාමය | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය (TEC) (රු.මි.) | සමුච්චිත වියදම (මි.රු) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය (%) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 6 | වත්මන් හා අනාගත තාක්ෂණයන් සඳහා ආරක්ෂණ ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් සංවර්ධනය (Development of Policies and Standards for current and future technologies) | ඩිජිටල් වත්කම් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක පාලනයන් ක්‍රියාත්මක කිරීමට අදාළ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් සංවර්ධනය කිරීම. | 2024 | 22.50 | 4.00 | 40% | ප්‍රමිතීන් සහ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා ප්‍රසම්පාදනය සම්පූර්ණ කර ඇත. සයිබර් ආරක්ෂාව සඳහා තාක්ෂණික ප්‍රමිතීන් සංවර්ධනය කිරීමේ සේවා ලබා ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කර ඇත. |
| 7 | මාර්ගගත ක්‍රමවේදවල ආරක්ෂාවසයිබර් , ආරක්ෂණය හා සමාජ මාධ්‍යවල ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම (Raise awareness on on-line safety, cyber Security and Social Media Security) | පාර්ශවකරුවන් අතර සයිබර් ආරක්ෂාව සහතික කිරීම සහ සයිබර් තර්ජන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ඇතිවිය හැකි සයිබර් තර්ජන සහ අවදානම් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම. | 2024-2025 | 20.00 | 2.30 | 50% | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් පාලන අමාත්‍යාංශය රජයේ ආයතන සඳහා දිස්ත්‍රික් මට්ටමින් සයිබර් ආරක්ෂණ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීමට ශ්‍රී ලංකා CERT ආයතනයට පහසුකම් සැලසීමට එකඟ විය. ශ්‍රී ලංකා CERT සඳහා TikTok වෙතින් සෘජු (Green Channel) ලබා ගන්නා ලදී. |
| 8 | වෝහාරික ඒකකවල ධාරිතාව ඉහළ නැංවීම (Enhance the Capabilities of Forensic Units) | ඩිජිටල් වෝහාරික (Digital Forensic) ක්‍රියාවලිය ප්‍රශස්ත කිරීම, නීති ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් සහයෝගයක් ලබා දීම සහ අනිෂ්ට (Malware) මෘදුකාංග විශ්ලේෂණ පහසුකම් ස්ථාපිත කිරීම. | 2024-2025 | 19.00 | 6.40 | 35% | මෘදුකාංග සහ දෘඩාංග ප්‍රසම්පාදයේ ප්‍රගතියක් දක්වා ඇත. සේවා සැපයුම් මධ්‍යස්ථානය සහ NAS ප්‍රසම්පාදනය සම්පූර්ණ කර ඇත. |

## සයිබර් ආරක්ෂාව සහ පුද්ගලික දත්ත ආරක්ෂණය වර්ධනය කිරීම

### 1. සයිබර් ආරක්ෂණ පනත සම්මත කිරීම

ශ්‍රී ලංකාව සයිබර් ආරක්ෂණ පනත් කෙටුම්පත සකස් කර ඇත්තේ සිවිල් සයිබර් ආරක්ෂණ අංශ ආමන්ත්‍රණය කිරීම සඳහා නියාමන රාමුවක් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කරමිනි. මෙයට ජාතික තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම් (CNII) ආරක්ෂා කිරීම සඳහා නීතිමය විධිවිධාන ශක්තිමත් කිරීම, ශ්‍රී ලංකා සයිබර් ආරක්ෂණ අධිකාරිය (CSA) පිහිටුවීම සහ පුරවැසියන් සඳහා ආරක්ෂිත සහ සුරක්ෂිත සයිබර් පරිසරයක් නිර්මාණය කිරීම ඇතුළත් වේ. සයිබර් සිදුවීම් ඵලදායී ලෙස වැළැක්වීම, හඳුනා ගැනීම, අවම කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා සයිබර් ආරක්ෂණ අංශ නියාමනය කිරීමේදී මෙම නීතිමය රාමුව ඉතා වැදගත් වේ. මෙම පනත 2025 පළමු කාර්තුවේදී සම්මත කෙරේ.

### 2. සයිබර් ආරක්ෂණ උපායමාර්ගය 2025-2029

සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන් රජය 2025 සිට 2029 දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිත ජාතික සයිබර් ආරක්ෂණ උපායමාර්ගය කෙටුම්පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. ශ්‍රී ලංකාව 2019 දී පළමු ජාතික තොරතුරු සහ සයිබර් ආරක්ෂණ උපායමාර්ගය දියත් කර 2023 දෙසැම්බර් දක්වා ක්‍රියාත්මක කළ අතර, සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මෙම උපායමාර්ගය සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් පසු ශ්‍රී ලංකාවේ ප්‍රගතිය ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකයේ (GCI) "ඉදිරි ප්‍රගතියක් දක්වන" රටක් ලෙස පිළිගැනීමෙන් පිළිබිඹු වන අතර, එය කුළුණු හරහා සයිබර් ආරක්ෂණ භාවිතයන් වැඩිදියුණු කිරීම ඉස්මතු කරයි.

ලෝක බැංකුවේ සහාය ඇතිව, ශ්‍රී ලංකා CERT ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ජාතික සයිබර් ආරක්ෂණ උපායමාර්ගයේ දෙවන අදියර: විශේෂයෙන් සිවිල් සයිබර් ආරක්ෂණ අංශ ආමන්ත්‍රණය කිරීම 2025 - 2029, ආරම්භ කරන ලදි. මෙම උපායමාර්ගය ජාතිය මුහුණ දෙන පරිණාමය වන සයිබර් ආරක්ෂණ අභියෝග ආමන්ත්‍රණය කිරීමට සහ රටේ සයිබර් පරිසර පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව සහ විශ්වාසවන්තභාවය තවදුරටත් ශක්තිමත් කිරීමට අරමුණු කරයි. මෙම සයිබර් ආරක්ෂණ උපායමාර්ගය ශ්‍රී ලංකාව සඳහා වන DoiT 5.0 ඩිජිටල් ප්‍රතිපත්තියේ දක්වා ඇති ඩිජිටල් පරිවර්තනය, නවෝත්පාදනය සහ ආර්ථික වර්ධනයේ පුළුල් ඉලක්කවලට සහාය වන අතරම රටේ සයිබර් ආරක්ෂණ තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා මාර්ග සිතියමක් ලෙස ක්‍රියා කරයි.

මෙම නව උපායමාර්ගය මගින් CNII ආරක්ෂා කිරීම සඳහා නීතිමය විධිවිධාන ශක්තිමත් කිරීම, සයිබර් අපරාධ නීතිමය රාමු ශක්තිමත් කිරීම, නීතිමය සමාලෝචන සහ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, අන්තර්ජාලය හා සම්බන්ධ උපාංග (IoT) සහ විමධ්‍යගත දත්ත දාමය (Blockchain) වැනි නව තාක්ෂණයන් හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීමට ක්‍රියාවලි, ප්‍රතිපත්ති සහ ප්‍රමිති ඇතුළුව යාන්ත්‍රණ ස්ථාපිත කිරීම මෙන්ම යන්ත්‍ර ඉගෙනීම සහ කෘතිම බුද්ධිය (AI) වැනි නැගී එන තාක්ෂණයන් කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන අවශ්‍ය නීතිමය සහ නියාමන රාමුව ගොඩනැගීම සඳහා මාර්ග සිතියමක් සපයයි. අනෙකුත් ප්‍රමුඛතා අතර උසස් අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණු අවස්ථා හරහා ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම, සයිබර් සිදුවීම් නිරීක්ෂණය කිරීමට, වැළැක්වීමට සහ ප්‍රතිචාර දැක්වීමට මෙන්ම ප්‍රතිසාධන හැකියාවන් ශක්තිමත් කිරීමට රටේ හැකියාව වැඩි දියුණු කිරීම, ගෝලීය වශයෙන් සහයෝගීතාව වැඩි කිරීම සහ සම්බන්ධීකරණය සහ විශ්වාසය ගොඩනැගීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ඇතුළුව ශක්තිමත් සයිබර් ආරක්ෂණ පරිසර පද්ධතියක් ගොඩනැගීම සඳහා දේශීය හවුල්කාරිත්වයන් උපයෝගී කර ගැනීම ඇතුළත් වේ.

## 3. රාජ්‍ය ආයතන සඳහා තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය

2022 වසරේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙම ප්‍රතිපත්තිය, තොරතුරු දැනගැනීමේ අයිතිය පනත යටතේ "රාජ්‍ය අධිකාරීන්" ලෙස නම් කර ඇති සියලුම රාජ්‍ය ආයතනවල එය ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කිරීමෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ සයිබර් ආරක්ෂණ තත්ත්වය ශක්තිමත් කරයි. මෙම ප්‍රතිපත්තිය ISO 27001 සහ NIST සයිබර් ආරක්ෂණ රාමුව වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන් මත ගොඩනගා ඇති අතර, සංවිධානාත්මක සයිබර් ආරක්ෂණ වැඩසටහන් ස්ථාපිත කිරීම සඳහා අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් භාවිතා කරයි. තො.ස. තාක්ෂණ වත්කම් හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම, සයිබර් ආරක්ෂණ සිදුවීම් හඳුනා ගැනීම සහ ප්‍රතිචාර දැක්වීම සහ සයිබර් ප්‍රහාරවලින් ඵලදායී ලෙස යථා තත්ත්වයට පත්වීම සඳහා පුළුල් ක්‍රියාමාර්ග මාලාවක් එහි දක්වා ඇත. මෙම මුලපිරීම මඟින් පුරවැසි දත්ත සුරක්ෂිත කිරීම, රාජ්‍ය සේවාවන්හි ඩිජිටල් විශ්වාසය ගොඩනැගීම සහ ආරක්ෂිත සහ ඔරොත්තු දෙන ඩිජිටල් ආර්ථිකයකට දායක වීම සඳහා රාජ්‍ය සංවිධාන අවශ්‍ය තාක්ෂණයන්, ප්‍රමිතීන් සහ නීතිමය රාමුවලින් හොඳින් බලගැන්වී ඇති බව සහතික කරයි.

මෙම මුලපිරීම් ආරක්ෂිත ඩිජිටල් පරිසර පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම සහ ඩිජිටල්කරණය, නවෝත්පාදනය සහ ඩිජිටල් ආර්ථික වර්ධනයේ පුළුල් ඉලක්කවලට සහාය වීම සඳහා ශ්‍රී ලංකාවේ සමස්ත ප්‍රවේශය පිළිබිඹු කරයි. නැගී එන අභියෝග ආමන්ත්‍රණය කිරීම සහ ගෝලීය හොඳම භාවිතයන් උපයෝගී කර ගැනීමෙන්, ශ්‍රී ලංකා රජය අනාගතයට සූදානම්, ඩිජිටල් වශයෙන් බල ගැන්වූ ජාතියක් සඳහා මග සකස් කරමින් සිටී.

### ආයතනයේ අනාගත සැලසුම් - SL CERT

### සයිබර් තර්ජන හඹා යාමේ සහ අනිෂ්ට මෘදුකාංග විශ්ලේෂණ රසායනාගාරයක් (Threat Hunting and Malware Analysis Lab) පිහිටුවීම

මෙම මුලපිරීමේ අරමුණ වන්නේ අති නවීන මෙවලම් සහ තාක්ෂණයන් සහිත විශේෂිත තර්ජන හඹා යාමේ සහ අනිෂ්ට මෘදුකාංග විශ්ලේෂණ රසායනාගාරයක් ස්ථාපිත කිරීමයි. අනිෂ්ට මෘදුකාංග සහ ඉහළ මට්ටමේ දිගු කාලීනව පැවතිය හැකි තර්ජන (Advance Persistent Threat) හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ අවම කිරීම මෙහි කාර්යභාරයයි. තර්ජන හඹා යාම සහ අනිෂ්ට මෘදුකාංග විශ්ලේෂණය පිළිබඳ විශේෂඥ දැනුමක් ලබා ගැනීමට වෘත්තිකයන් කණ්ඩායමක් පුහුණු කරනු ලැබේ. ක්‍රියාකාරී තර්ජන හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වූ ක්‍රමවේද (ප්‍රොටෝකෝල) සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ. දැනුම බෙදාගැනීම සහ තර්ජන පිළිබඳ බුද්ධි තොරතුරු හුවමාරුව සඳහා ජාත්‍යන්තර සයිබර් ආරක්ෂණ සංවිධාන සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. අනුමැතිය සඳහා යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

## 8.2 විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (*TRCSL)*

| අ/අ | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (TEC) (රු. මි.) | 2024.12.31 වන විට සමුච්චිත වියදම (රු. මි.) | 2024.12.31 වන විට භෞතික ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | ස්මාර්ට් පාසල් ව්‍යාපෘතිය පාසල් 1000 කට ස්මාර්ට් පුවරු ලබා දීම | සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල්කරණය කිරීම සඳහා පාසල්වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම | 2024-2025 | 700.00 | 1,063.00 | 60% | ස්මාර්ට් පුවරු 1000 ක් ආනයනය කර පරීක්ෂා කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් පාසල් වෙත බෙදා හරිනු ලැබේ. |
| 2 | පාසල් ෆයිබර් සම්බන්ධතා ව්‍යාපෘතිය | පාසල්වලට අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවයක් ලබා දීම | 2024-2025 | 500.00 | 3.00 | 50% | පාසල් 500 කට සම්බන්ධතාවය ලබා දී ඇත. 2025 දී තවත් පාසල් 500 කට සම්බන්ධතාවය ලබා දීමට අපේක්ෂා කෙරේ. |
| 3 | ගමට සන්නිවේදනය - Connect Sri Lanka) ව්‍යාපෘතිය (සන්නිවේදන කුළුණු ඉදිකිරීම) | රට පුරා පුළුල් 4G / ෆයිබර් බ්‍රෝඩ්බෑන්ඩ් ආවරණයක් සහතික කිරීම මගින් තාක්ෂණයෙන් බලගැන්වූ සමාජයක් සහ සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය වූ ශ්‍රී ලංකාවක් ස්ථාපිත කිරීම. | 2021-2025 | 1,367.5 | 486.06 | 21% | ව්‍යාපෘතියේ ආවරණය පහත පරිදි වේ;<br>රත්නපුර - 35<br>කුරුණෑගල - 35<br>මාතර - 21<br>මහනුවර - 33<br>අනුරාධපුර - 31<br>බදුල්ල - 34<br>කළුතර - 34<br>කෑගල්ල - 34<br>යාපනය - 11<br>ත්‍රිකුණාමලය - 08<br>මාතලේ - 21<br>මුළු සංඛ්‍යාව 297කි. එය පහත වගුවේ දැක්වේ. |

*TRCSL අරමුදල් සපයන ලද

**ගමට සන්නිවේදනය – 31.12.2024 දිනට ප්‍රගතිය**

| **දිස්ත්‍රික්ක** | **මුලු කුළුණු සංඛ්‍යාව** | තවමත් ලියකියවිලි ඉදිරිපත් කර නොමැත | **අධිකාරී අනුමැතිය ක්‍රියාවලිය තුළ** | **Final approval granted by TRCSL (කොන්ත්‍රාත්තුව තවමත් ආරම්භ කර නැත/** | **On-aired** |
|---|---|---|---|---|---|
| රත්නපුර | 35 | 02 | 01 | 01 | 31 |
| කුරුණෑගල | 35 | 03 | 07 | 04 | 21 |
| මාතර | 21 | 06 | 07 | 05 | 03 |
| නුවර | 33 | 20 | 05 | 08 | - |
| අනුරාධපුර | 31 | 13 | 14 | 04 | - |
| බදුල්ල | 34 | 21 | 07 | 05 | 01 |
| කලුතර | 34 | 07 | 16 | 10 | 01 |
| කෑගල්ල | 34 | 08 | 09 | 11 | 06 |
| යාපනය | 11 | 08 | - | 03 | - |
| ත්‍රිකුණාමලය | 08 | 07 | 01 | - | - |
| මාතලේ | 21 | 19 | - | 02 | - |
| **එකතුව** | **297** | **114** | **67** | **53** | **63** |

*****02 sites temporarily on-aired by mobitel (Kalutara – Wawella / Kegalle – Dickellakanda

### ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් අංක 39, 2024

මෙම පනත වසර 28කට පසු සංශෝධනය කර 2024/07/17 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. මෙම සංශෝධන මගින් පිළිගත් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වඩා තරඟකාරී සහ සාධාරණ වෙළඳපොළක් නිර්මාණය කිරීම සඳහා රෙගුලාසි හඳුන්වා දීමට ඉඩ ලබා දී ඇත.

### දුරකතන අංකය මාරු නොවී ජාල අතර ක්‍රියාත්මක වීම

මෙය ක්‍රියාත්මක කිරීමෙන්, ස්ථාවර හෝ ජංගම ග්‍රාහකයෙකුට මුල් අංකය රඳවා ගනිමින් ක්‍රියාකරු වෙනස් කළ හැකිය. කොමිෂන් සභාව විසින් අංක අතේ ගෙන යාමේ නීති සහ මාර්ගෝපදේශ සඳහා අනුමැතිය ලබා දී ඇත. සිංහල සහ දෙමළ පරිවර්තන සිදු වෙමින් පවතී. මූල්‍ය ඇගයීම ප්‍රගතියේ පවතී. එය ඉදිරි මාස තුන තුළ ක්‍රියාත්මක වනු ඇත.

## 8.3 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව *(DRP)*

| අඅ/ | ව්‍යාපෘති නාමය | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය (TEC) (රු. මි.) | සමුච්චිත වියදම (රු. මි) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය (%) 2024.12.31 දක්වා | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය (e-NIC Project) | වයස අවුරුදු 15 සහ ඊට වැඩි පුරවැසියන් ලියාපදිංචි කිරීම සඳහා ආරක්ෂිත, මධ්‍යගත විද්‍යුත් ගබඩාවක් (ජාතික පුද්ගල ලේඛනය - NRP) ස්ථාපිත කිරීම සහ විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම | 2015-2025 | 6,000.89 | 4,394.55 | 84% | දිස්ත්‍රික්-DRP ඒකක 335ක් සහ පළාත් DRP ඒකක පළාත් 5ක ස්ථාපිත කර ඇත.<br><br>නුවරඑළියේ ආපදා ප්‍රතිසාධන දත්ත මධ්‍යස්ථානය (DRDC) සහ ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන දත්ත මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත.<br><br>සෑම සුදුසුකම් ලත් පුරවැසියෙකුගේම චරිතාපදාන, ජෛවමිතික සහ ICAO සම්මත ඡායාරූප ලබා ගැනීම සඳහා දිවයින පුරා දත්ත ග්‍රහණය කිරීමේ වැඩසටහන 2025 දෙවන කාර්තුව තුළ ආරම්භ කෙරේ.<br><br>අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ eNIC ව්‍යාපෘතිය සමඟ ඒකාබද්ධව SLUDI ක්‍රියාත්මක කිරීම. |

## *8.4* ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය *(ICTA)*

| අං/ | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (TEC)(රු.මි) | 2024.12.31 වන විට සමුච්චිත වියදම (රු.මි.) | 2024.12.31 වන විට භෞතික ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | තාක්ෂණික විසරණ ව්‍යාපෘතිය | නව තාක්ෂණයන් සංවර්ධනය කිරීම, දේශීය හා ගෝලීය ව්‍යාපාර සඳහා පවතින සහ නව තාක්ෂණයන් විසරණය කිරීම සහ තාක්ෂණයන් ඵලදායී ලෙස භාවිතා කිරීමෙන් ව්‍යාපාර පරිවර්තනය කිරීම. | 2021-2024 | 1,002.00 | 0.19 | 23% | කෘෂිකර්මාන්තය ආශ්‍රිත SME 37 ක් සඳහා තාක්ෂණික අනුවර්තනය සිදු කර ඇත - SME 37 කට සහාය ලබා දී ඇති අතර ඔවුන් ස්මාර්ට් කෘෂිකර්මය භාවිතා කළහ .<br>දේශීය තාක්ෂණ සමාගම් හරහා කර්මාන්ත සහ රජයේ පාර්ශවකරුවන් අතර තාක්ෂණික දැනුම වැඩි කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ 12 ක් සහභාගිවන්නන් 806ක් සමඟ පවත්වන ලදී. |
| 2 | ඩිජිටල් වශයෙන් ඇතුළත් ශ්‍රී ලංකාවක් සඳහා ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන | පුරවැසියන් ඩිජිටල් තාක්ෂණයන් භාවිතා කිරීමට දිරි ගැන්වීම - අනාගතයට සරිලන රැකියා කළ හැකි ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම - රජයේ සේවකයින්ගේ ධාරිතාව සහ ඩිජිටල් නිපුණතා වැඩි දියුණු කිරීම | 2021-2024 | 1,005.00 | 4.40 | 55% | ඒකාබද්ධ ධාරිතා ගොඩනැගීමේ ආකෘතිය සංවර්ධනය කර ඇත. NextGenGov මුලපිරීම යටතේ ප්‍රධාන පුහුණුකරුවන් 150 ක් සහ රජයේ නිලධාරීන් 1,799 ක් පුහුණු කර ඇත. |

| අං/ | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (TEC) (රු.මි.) | 2024.12.31 වන විට සමුච්චිත වියදම (රු.මි.) | 2024.12.31 වන විට භෞතික ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 3 | සේවක භාර අරමුදල් (ETF) කළමනාකරණ පද්ධතිය | සේවක භාර අරමුදල් මණ්ඩලයේ (ETFB) අරමුදල් කළමනාකරණ පද්ධතිය සහ අදාළ සේවාවන් සඳහා කාර්යක්ෂම සේවා සැපයීමට ICT විසඳුමක් සංවර්ධනය කිරීම මගින් ETF කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා මධ්‍යගත විසඳුමක් ක්‍රියාත්මක කිරීම | 2016-2018 extended up to 2024 | 100.00 | 80.64 | 99% | ETF පද්ධතිය සම්පූර්ණ කරන ලදී, වෙනස්කිරීම් ඉල්ලීම් 11ක් සහ පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණය (UAT) සිදු කරන ලදී. පරිශීලක පුහුණුව සහ TOT (පුහුණුකරුවන් පුහුණු කිරීම) සම්පූර්ණ කරන ලදී. |
| 4 | ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් (NSDI) - දෙවන අදියර | අවකාශීය දත්ත බෙදා ගැනීමට සහ ඵලදායී තීරණ ගැනීම සඳහා තනි වේදිකාවක් සංවර්ධනය කිරීම | 2016-2022 | 530.00 | 175.27 | 90% | NSDI වේදිකාව සාර්ථකව සම්පූර්ණ කර ක්‍රියාත්මක වේ (www.nsdi.gov.lk). 2022-2024 සඳහා NSDI ප්‍රතිපත්තිය සහ NSDI මාර්ග සිතියම සකස් කර ඇත. NSDI ප්‍රතිපත්තිය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගත යුතුය. |
| 5 | රජයේ තොරතුරු මධ්‍යස්ථානය (GIC) කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම | රජයේ සේවාවන් පිළිබඳ යාවත්කාලීන තොරතුරු සහිත සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන රජයේ තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | 2016-2022 යාවත්කාලීන වන තෙක් දීර්ඝ කරන ලදී | 105.90 | 341.78 | 100% | ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම අඛණ්ඩව සිදු කෙරේ. වැඩිදියුණු කිරීම් සිදු කරමින් පවතී. |

| අඅ/ | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (TEC) (රු . .මි) | 2024.12.31 වන විට සමුච්චිත වියදම (රු.මි.) | 2024.12.31 වන විට භෞතික ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 6 | තාක්ෂණ කර්මාන්ත සංවර්ධන වැඩසටහන (IT BPM කර්මාන්තයේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීමට සහ නව තාක්ෂණික පදනම් වූ ව්‍යාපාර හරහා රැකියා අවස්ථා වැඩි දියුණු කිරීමට) | IT-BPM කර්මාන්තයේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීමට සහ නව තාක්ෂණික පදනම් වූ ව්‍යාපාර හරහා රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම | 2021-2024 | 759.00 | 2.94 | 41% | IT-BPM සමාගම් 30 ක අපනයන සූදානම වැඩි කර ඇත. IT-BPM සමාගම් 15 ක් එකින් එක ව්‍යාපාර පුහුණු කිරීම සඳහා සම්බන්ධ කර ඇත. IT-BPM සමාගම්වල සේවකයින් 260 කට නැවත කුසලතා සහ උසස් කුසලතා ලබා ගැනීමට සහාය විය. ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට බහුජාතික සමාගම් සමඟ ජාතික ඩිජිටල් සම්මේලනයක් පැවැත්වීය. |
| 7 | ආරම්භක සහ පරිමාණ වැඩසටහන | ශ්‍රී ලංකාවේ තාක්ෂණ කර්මාන්තයේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම | 2021-2024 | 625.00 | 24.32 | 81% | ව්‍යාපාර 30 කට වෙළඳපල ප්‍රවේශ අවස්ථා පහසුකම් සපයා ඇත. බ්‍රැන්ඩික්ස් විසින් රු. මිලියන 25 ක් වටිනා ප්‍රදාන අරමුදල් සමඟ ආරම්භක 20 කට සහාය දී ඇත. |

| අඅ/ | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (TEC) (රු . (.මි | **2024.12.31** වන විට සමුච්චිත වියදම (රු.මි.) | **2024.12.31** වන විට භෞතික ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 8 | ප්‍රාදේශීය පොකුරු සංවර්ධනය | ප්‍රාදේශීය තාක්ෂණ පොකුරු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා හිතකර පරිසර පද්ධතියක් ස්ථාපිත කිරීම, එමඟින් ව්‍යවසායකත්ව නවෝත්පාදනය, තාක්ෂණ ව්‍යාප්තිය සහ කලාපයේ වැඩි තාක්ෂණික පදනම් වූ රැකියා ලබා දීම | 2021-2024 | 163.00 | 1.40 | 50% | යාපනය තාක්ෂණ ව්‍යාප්ති ඒකකය ස්ථාපිත කිරීම ප්‍රගතියේ පවතී. සංකල්පීය අවධිය සාර්ථකව නිම කර ඇත. SLT සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟ සහයෝගයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ ඉගෙනුම් සහ නවෝත්පාදන මධ්‍යස්ථානය (LIC) ස්ථාපිත කිරීම සඳහා ස්ථානයක් අවසන් කර ඇත. ඉගෙනුම් සහ නවෝත්පාදන මධ්‍යස්ථානය සඳහා අවශ්‍යතා හඳුනා ගැනීම සහ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම ද සම්පූර්ණ කර ඇත. සමාගම් රෙජිස්ට්‍රාර් (ROC) සමඟ සහයෝගයෙන් අතථ්‍ය ආරම්භක සායනයක් සහ තෝරාගත් ආරම්භක සඳහා තවත් සායන තුනක් පවත්වන ලදී. |

| අඅ/ | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ | ව්‍යාපෘති කාලය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (TEC) (රු . (.මි | **2024.12.31** වන විට සමුච්චිත වියදම (රු.මි.) | **2024.12.31** වන විට භෞතික ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 9 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව (GAD) සඳහා ICT විසඳුම | GAD විසින් සිදු කරන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩි කිරීම. GAD හි අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන් සහ පුරවැසියන් නිසි ICT විසඳුම් හඳුන්වා දීමෙන් බොහෝ ආකාරවලින් ප්‍රතිලාභ ලබනු ඇත. | 2016-2018 2024 දක්වා දීර්ඝ කරන ලදී | 40.00 | 30.02 | 90% | පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණය (UAT) සහ පරිශීලක පුහුණුව සම්පූර්ණ කර ඇත. |
| 10 | රජයේ ඩිජිටල් පෝරම | රජයේ සංවිධාන සඳහා නිෂ්පාදනය කරන ලද ඩිජිටල් පෝරම සඳහා පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන වේදිකාවක් ස්ථාපිත කිරීම | 2021-2024 | 84.00 | 7.17 | 50% | 2022 දී forms.gov.lk විසඳුම සංවර්ධනය කිරීම සම්පූර්ණ කරන ලදීනියමු පදනම මත . ආයතන9 ක විසඳුම් ස්ථාපිත කර ඇත. සක්‍රීය සජීවී පෝරම 7 ක් තිබේ. |

* ICTA ආයතනය ඇවර කරමින් පවතින බැවින්, 2025 වර්ෂයේදී අත්‍යාවශ්‍ය ව්‍යාපෘති පමණක් සිදු කෙරේ.

## 8.5 දත්ත ආරක්ෂණ අධිකාරිය (*DPA)*

පුද්ගලික දත්ත ආරක්ෂණ පනතේ (PDPA) 31 වන වගන්තිය යටතේ පුළුල් අරමුණු සහිත ස්වාධීන ආයතනයක් ලෙස දත්ත ආරක්ෂණ අධිකාරිය (DPA) ව්‍යුහය නීතිය යටතේ සකස් කර ඇත. එය පාලනය කරනු ලබන්නේ සහ පරිපාලනය කරනු ලබන්නේ පුද්ගලික දත්ත ආරක්ෂණ පනතේ (PDPA) (29 සහ 30 වගන්ති) විවිධ නිර්ණායක මත පදනම්ව ජනාධිපති විසින් පත් කරන ලද සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. මණ්ඩලය විසින් පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙහි දෛනික කාර්යාල කටයුතු කළමනාකරණය කරනු ලැබේ.

DPA හි ප්‍රධාන ප්‍රමුඛතා පහත පරිදි වේ:

1. ආයතනික ධාරිතා ගොඩනැගීම
2. අනුකූලතාවය මෙහෙයවීම සහ අධීක්ෂණය යටතේ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම
3. පුරවැසි අයිතිවාසිකම් සහ අපගේ කාර්යභාරය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් තුළින් මිනිසුන් සුරක්ෂිත කිරීම සහ සවිබල ගැන්වීම
4. ඵලදායී විමර්ශන සහ බලාත්මක කිරීම
5. ජාත්‍යන්තර සහ කලාපීය සහයෝගීතාවය

පනතෙහි අංශ කිහිපයක් ක්‍රියාත්මක කිරීම 2024 ජනවාරි 8 වන දින ගැසට් නිවේදනය ගැසට් නිවේදනය මගින් පහත සඳහන් බලාත්මක කිරීමේ දිනයන්ට අදාළ නියෝග නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන ලදී. (විෂය බාර අමාත්‍යවරයා ලෙස හිටපු ජනාධිපති විසින් ප්‍රකාශයට පත් කරන ලද නිවේදන)

- පනතේ VI, VIII, IX සහ X කොටස්වල විධිවිධාන ක්‍රියාත්මක වන දිනය ලෙස 2023 දෙසැම්බර් 1 වන දින
- පනතේ I, II, III සහ VII කොටස්වල විධිවිධාන ක්‍රියාත්මක වන දිනය ලෙස 2025 මාර්තු 18 වන දින

- උපාය මාර්ගයක් (Strategy) සහ ක්‍රියාත්මක කිරීමේ මාර්ග සිතියමක් (Operational Roadmap) සකස් කිරීම (යුරෝපීය කොමිසමේ තාක්ෂණික සහාය ඇතිව)
- මානව සම්පත් සහ පරිපාලනය සඳහා ක්‍රියා පටිපාටි අත්පොතක් සකස් කිරීම (UNOPS හි තාක්ෂණික සහාය මගින්)
- පැමිණිලි හැසිරවීම, විමර්ශනය සහ බලාත්මක කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) සංවර්ධනය කටයුතු ආරම්භ කර ඇති අතර ඒවා ක්‍රියාත්මක වෙමින් පවතී (යුරෝපීය කොමිසමේ තාක්ෂණික සහාය ඇතිව)
- විගණන කමිටුව, නීති කමිටුව, අලෙවිකරණ සහ සන්නිවේදන අනුකමිටුව සහ මානව සම්පත් සහ පරිපාලන (තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඇතුළුව) අනුකමිටුව යන සියලු කමිටු ක්‍රමානුකූලව සම්බන්ධීකරණය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම අභ්‍යන්තර කමිටුව විසින් සිදු කරයි.
- ‘රාජ්‍ය අංශයේ PDPA යෙදීම සහ DPA පිළිබඳ හැඳින්වීම’ යන මැයෙන් අධිකාරියේ.පළමු චක්‍රලේඛය භාෂා තුනෙන්ම (2024 සැප්තැම්බර් 13 දිනැති චක්‍රලේඛ අංක 01/2024) නිකුත් කරන ලදී.
- අනෙකුත් නීතිමය සහ ප්‍රතිපත්තිමය ලියකියවිලි සහ DPA පිළිබඳ තොරතුරුපාර්ශවකරුවන්ගේ අදහස් : සඳහා කෙටුම්පත්ආකාරයෙන් DPA වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලද නියෝග, මාර්ගෝපදේශ, නීති සහ රෙගුලාසි නවයක් )9) ඇතුළුව.
- DPA මණ්ඩල සාමාජිකයින් සහ නිලධාරීන්ගේ දැනුවත් කිරීමේ වැඩසටහන් :Fedrich Naumann පදනම, SLASSCOM, නීතිඥ සංගමය, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනය, ලංකා වාණිජ මණ්ඩලය, මුදල් අමාත්‍යාංශය, ජර්මානු AHK සංගමය සහ Ada Derana හි සැසි සංසද ඇතුළුව/PDPA පිළිබඳ

- බොහෝ දැනුවත් කිරීමේ සැසි සංසදවලට/DPA මණ්ඩල සාමාජිකයින් සහ නිලධාරීන් සහභාගී වී ඇත. ඔවුන් ඇමරිකා එක්සත් ජනපදයේ (වොෂින්ටන් DC) සහ ජර්මනියේ Bonn / Berlin උපදේශනය සඳහා ආරාධනා කර ඇත.

පහත ප්‍රමුඛතා තේමාත්මක ක්ෂේත්‍ර පහෙන් (05) ආරම්භ කරමින් උපදේශක කමිටු පත් කිරීමට මණ්ඩලය තීරණය කර ඇත:

- සෞඛ්‍ය සේවා
- මූල්‍ය, බැංකු සහ ප්‍රාග්ධන වෙළඳපොළ, විදුලි සංදේශ සහ රක්ෂණය
- රැකියා
- ළමුන් සහ අදාළ ගැටළු
- සංචාරක

අධ්‍යක්ෂ මණ්ඩලය පනතට සුළු සංශෝධන කිහිපයක් අවශ්‍ය බව සටහන් කර ඇති අතර, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් විධිමත් කිරීම සඳහා කෙටුම්පතක් සකස් කර ඇත. කැබිනට් මණ්ඩලය ප්‍රධාන සංශෝධන අනුමත කර ඇති අතර මීට පෙර පත් කරන ලද 2025 මාර්තු 18 වන දිනට වඩා බලාත්මක කිරීමේ දිනය දීර්ඝ කිරීමට අනුමත කර ඇත.

## 8.6 ශ්‍රී ලංකා ටෙලිකොම් *(SLT)*

**පසුගිය වසරේ සම්පූර්ණ කරන ලද ප්‍රධාන ව්‍යාපෘති**

**1. SLT ෆයිබර් ව්‍යාපෘතිය:**

මෙම ව්‍යාපෘතිය මගින් සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රදේශයකම අධිවේගී ෆයිබර් ලබා ගැනීමේ හැකියාව ලබා දීම සහ නේවාසික සහ වාණිජ පාරිභෝගිකයින් ඉලක්ක කරගත් ෆයිබර් නව සම්බන්ධතා සක්‍රීය කිරීම සඳහා fiber optic ජාලය පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. ෆයිබර් තාක්ෂණය පාරිභෝගිකයින්ට අන්තර්ජාල වේගය සහ විශ්වසනීයත්වය සහතික කරන අතර, වඩා හොඳ සම්බන්ධතාවයක් සහ වැඩිදියුණු කළ සේවා ගුණාත්මක බව සහතික කරයි. fiber යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමෙන්, මෙම ව්‍යාපෘතිය මගින් තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක වීමට මහජනතාවට සහ ව්‍යාපාරවලට අවස්ථාව සැලසීමෙන් රටේ ඩිජිටල් ආර්ථිකයට සහාය වේ. 2024 වර්ෂයේ ෆයිබර් ව්‍යාපෘතිය සඳහා SLT ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 17.2 ක් වූ අතර, පෙර ව්‍යාපෘති ගෙවීම් සහ වසර තුළ නව සම්බන්ධතා 104,000 ක් පමණ ලබා දීමද ඇතුළත් විය.

**2. දත්ත මධ්‍යස්ථාන සහ වලාකුළු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය:**

මෙම මුලපිරීමට උසස් විශේෂාංග, ධාරිතා ව්‍යාප්තිය සහ මතුවෙමින් පවතින Cloud සේවා සඳහා සහාය දැක්වීමට පවතින දත්ත මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් පවතින දත්ත මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළත් විය. වැඩි වූ ගබඩා ධාරිතාව, වැඩිදියුණු කළ ආරක්ෂක පියවර සහ පරිමාණය කළ හැකි කාර්යක්ෂම Cloud විසඳුම් ලබා දීම සහ නවීන තාක්ෂණයන් ඒකාබද්ධ කිරීම වැඩිදියුණු කිරීම් ඇතුළත් පහසුකම් ගනුදෙණුකරුවන්ට හිමි වේ. විශ්වාසදායක සහ ආරක්ෂිත දත්ත මධ්‍යස්ථාන සහ Cloud සේවා ව්‍යාපාර සඳහා ලබා දීමෙන්, ඩිජිටල් පරිවර්තනය පහසු කිරීමෙන් සහ Tech Startups සහ ව්‍යවසායන්හි වර්ධනයට සහාය වීමෙන් මෙම ව්‍යාපෘතිය ඩිජිටල් ආර්ථිකය ඉහළ නංවයි. අතිරේක ගබඩා ධාරිතාවන් ඇතුළුව අතිරේක සමස්ථානික අවකාශයන්(colocation) 60 කින් දත්ත මධ්‍යස්ථාන ධාරිතාව වැඩි දියුණු කරන ලදී. තවද multi cloud පරිසරයක් සහ OpenShift මත පදනම්

වූ Kubernetes පොකුරක් ආයතන සඳහා හඳුන්වා දෙන ලදී. අනාගත ඉල්ලීම් සපුරාලීම සඳහා දත්ත මධ්‍යස්ථාන ජාලකරණ ව්‍යුහය ද මෘදුකාංග නිර්වචනය කළ ජාල ගෘහ නිර්මාණ ශිල්පයට පරිවර්තනය කරන ලදී.

**3. පාසල් ෆයිබර්කරණ ව්‍යාපෘතිය:**

මෙම පාසල් ෆයිබර්කරණ ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අධිවේගී ෆයිබර් සම්බන්ධතාවයකින් ග්‍රාමීය පාසල් සහ fiber footprint පුළුල් කිරීමෙන් නව තාක්ෂණයෙන් තොර ද්විතීයික මට්ටමේ පාසල් අන්තර්ජාලයට සම්බන්ධ කිරීමයි. අධිවේගී අන්තර්ජාල පහසුකම් සැපයීමෙන්, මෙම ව්‍යාපෘතිය දුරස්ථ ප්‍රදේශවල සිසුන් සහ ගුරුවරුන් සඳහා ඩිජිටල් ඉගෙනුම් සහ අධ්‍යාපනික සම්පත් පහසු කළ අතර, ඩිජිටල් බෙදීම පියවා අධ්‍යාපනික සමානාත්මතාවය ප්‍රවර්ධනය කළේය. අත්‍යවශ්‍ය ඩිජිටල් කුසලතා සහ දැනුම සමඟ අනාගත ශ්‍රම බලකාය සන්නද්ධ කිරීමෙන්, වඩාත් ඇතුළත් සහ දක්ෂ සමාජයක් පෝෂණය කිරීමෙන් මෙම ව්‍යාපෘතිය රටේ අධ්‍යාපනික සංවර්ධනයට සහාය වේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ TRCSL හි මඟ පෙන්වීම යටතේ SLT ආයතනය දැනටමත් ද්විතීයික පාසල් 550 ක් සම්බන්ධ කර ඇති අතර, ඩිජිටල් gaps පියවමින් මෙම ව්‍යාපෘතිය අවසන් වන විට පාසල් 1000 ක් සම්බන්ධ කිරීම සිදු කරනු ඇත. SLT විසින් පෙර පාසල් ෆයිබර්කරණ ව්‍යාපෘති සමඟ පාසල් 3000 කට ආසන්න ප්‍රමාණයක් ෆයිබර් සමඟ සම්බන්ධ කර ඇත.

## ව්‍යාපෘති 2025

1. **SMW 6:**

මෙම ව්‍යාපෘතියට Marseille සහ සිංගප්පූරුව අතර කිලෝමීටර් 11500 ක පමණ දිග කේබල් එකකින් සහ 126 Tbps ධාරිතාවයකින් යුත් South-East Asia-Middle East-Western Europe 6 (SMW 6) සබ්මැරීන් කේබල් පද්ධතියේ ආයෝජනය කිරීම ඇතුළත් වේ. මහාද්වීප හරහා බහු රටවල් සම්බන්ධ කිරීමෙන් වේගවත් සහ වඩා විශ්වාසදායක අන්තර්ජාල සේවා සැපයීමෙන් ජාත්‍යන්තර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම මෙම ආයෝජනයේ අරමුණයි. ශ්‍රී ලංකාව සම්පූර්ණ ගොඩබෑමේ ස්ථානයක් (Full Landing Station) වන අතර මෙතෙක් කේබල් ගොඩබෑමේ ආයෝජන සහ ගොඩබෑමේ ස්ථාන සංවර්ධනය ප්‍රගතියක් ලබා ඇත. මෙම ව්‍යාපෘතිය බාධාවකින් තොරව ගෝලීය සන්නිවේදනය සක්‍රීය කරනු ඇත, වෙළඳ අවස්ථා වැඩි දියුණු කරනු ඇත, සහ ජාත්‍යන්තර ව්‍යාපාර රටට ආකර්ෂණය කර ගනු ඇත. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ වන විට SLT විසින් රුපියල් බිලියන 15 කට ආසන්න ආයෝජනයක් සම්පූර්ණ කරනු ඇත.

2. **ෆයිබර් නව සම්බන්ධතා 2025:**

SLT ෆයිබර් ව්‍යාපෘතිය අඛණ්ඩ උත්සාහයෙන් කරගෙන යමින්, මෙම මුලපිරීම නව පාරිභෝගිකයින් වෙත ෆයිබර් ඔප්ටික් සම්බන්ධතා පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. ජාල ආවරණය පුළුල් කිරීම, නිවාස සහ ව්‍යාපාර වැඩි ප්‍රමාණයකට අධිවේගී අන්තර්ජාල පහසුකම්වලින් ප්‍රයෝජන ගත හැකි බව සහතික කිරීම මෙහි ඉලක්කයයි. අතිරේක පාරිභෝගිකයින් 120,000 ක් පමණ මෙම ජාලයට සම්බන්ධ කිරීමට අපේක්ෂා කෙරේ.